Psychiatry in Ashthānga Ayurvedaga - with special reference to rituals



## 2

# අෂ්ටාංග ආයුර්වේදයේ එන භූත විද්‍යාව : ශාන්තිකර්ම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්

ජයන්ත ජයසිරි
මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**සාර සංක්ෂේපය**

ආයුර්වේදය යනු ඉන්දියාවේ බිහි වී සෙසු ආසියාතික රටවල් කරා පැතිරී ගිය වෛද්‍ය ක්‍රමයකි. ආයුෂ පිළිබඳ විද්‍යාව නොහොත් ආයුෂ පිළිබඳ ඥානය වශයෙන් හඳුන්වන මෙය වෛද්‍ය ක්‍රමයක් පමණක් නොව ජීවන දර්ශනයක් ද වේ. ආයුර්වේදයේ ප්‍රාථමික මූලාශ්‍රවල සඳහන් අන්දමට ආයුර්වේදය ප්‍රධාන අංග අටකින් සමන්විත වන අතර එය අෂ්ටාංග ආයුර්වේදය ලෙස හැඳින්වේ. භූත විද්‍යාව යනු අෂ්ටාංග ආයුර්වේදයේ එන අංගයකි. එහෙත් මෙකී අංශය වර්තමාන ආයුර්වේද අධ්‍යාපනය තුළින් ක්‍රමානුකූලව බැහැර වී ගොස් ඇති බව පෙනේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අෂ්ටාංග ආයුර්වේදයේ එන භූත විද්‍යාව පිළිබඳ විමර්ශනයක යෙදීමයි. මෙහිදී තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර, ලිඛිත මූලාශ්‍ර හා සහභාගීත්ව නිරීක්ෂණය යන ක්‍රමවේද යොදා ගන්නා ලදී. ආයුර්වේදයට අනුව භෞතික හා පාරිසරික සාධක මෙන් ම අධි ස්වාභාවික බලවේග මගින් ඇති කරන්නා වූ උපද්‍රව හේතුවෙන් ද මිනිසාට ලෙඩ රෝග වැළඳේ. එවැනි රෝග ඇතිවන ආකාරය සහ ඒවාට පිළියම් ද භූත විද්‍යාව මගින් පැහැදිලි කෙරේ. ජ්‍යොතිෂ්‍යය යනු භාරතයේ උපන් ඉපැරණි ම මානව ශාස්ත්‍රය වන අතර ආයුර්වේදයේ භූත විද්‍යාව ද ජ්‍යොතිෂ්‍යය සමඟ සම්බන්ධ වේ. බෙහෙවින් දියුණු අවධියක





පසුවන වර්තමානයේ පවා මිනිසුන්ගේ රෝගී චර්යාව තුළ අධිස්වාභාවික වත් පිළිවෙත්වලට සැලකිය යුතු ස්ථානයක් හිමිවේ. මිනිසාට වැළඳෙන බොහෝ රෝග මූලයන් මානසික කරුණු සමඟ සම්බන්ධවන හෙයින් භූත විද්‍යාවේ එන ප්‍රතිකාර විධීන් හි ප්‍රායෝගික වැදගත්කමක් ඇති බව හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පද** : ආයුර්වේදය, ශාන්තිකර්ම, භූත විද්‍යාව, අධි ස්වාභාවික බලවේග, ජ්‍යොතිෂය

## 1. හැඳින්වීම

ආයුර්වේදය වර්ෂ දහස් ගණනකට පෙරාතුව ඉන්දියාවේ ඉපදී ආසියාකරයේ ද, තවත් බොහෝ රටවල ද පැතිරී ගිය වෛද්‍ය ක්‍රමයකි. එහි පහළව ව්‍යාප්ති වී ගිය වෛද්‍ය විද්‍යාවේ ශාඛා පහක් අප රට කෙරෙහි ද බලපෑම් කරතිබේ. එනම්; ආයුර්වේදය, යුනානි ක්‍රමය, සිද්ධ ක්‍රමය, එම්ෂි ක්‍රමය සහ ප්‍රකෘතක චිකිත්සා ක්‍රමය වශයෙනි. මීට අමතරව ගැමි (ජන) වෙදකම පිළිබඳ අංශයක් ද ඇත. එය 'සිංහල වෙදකම' හෙවත් 'දේශීය චිකිත්සා' වශයෙන් ද හඳුන්වනු ලැබේ. දීර්ඝායුෂ පිළිබඳ අනුශාසනාව ලෙස සලකන ආයූර්වේදය ලොව මානුෂික ඥාණවලින් එකක් ලෙස ද සැලකේ. එමෙන්ම එය ආයුෂ පිළිබඳ විද්‍යාව, ජීවිතය පිළිබඳ විද්‍යාව වශයෙන්ද හඳුන්වනු ලැබේ. ආයුෂ පිළිබඳ ඥාණය යම ශාස්ත්‍රයකින් දැනගත හැකි වේද, එය ආයූර්වේදය ලෙස සලකනු ලබන අතර, ආයුෂයට හිත දෙය ද, අහිත දෙය ද, රෝගයනට හේතු සහ රෝග සංසිඳුවන උපායන් ද, විස්තර කොට ඇති ශාස්ත්‍රය ආයූර්වේදය යනුවෙන් නිර්වචනය කෙරේ.

ආයූර්වේදය අංග අටකින් යුක්ත වන අතර, ඒ පිළිබඳ මූලධර්ම ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සැලකිය හැකි චරක සංහිතාවේත්, සශ්‍රැත සංහිතාවේත්, අෂ්ටාංග හෘදය සංහිතාවේත් සඳහන් වේ. චරක

සංහිතාව කාය චිකිත්සා සම්ප්‍රදායේ ප්‍රධාන ග්‍රන්ථය සේ සැලකේ. ශල්‍ය සම්ප්‍රදායේ ප්‍රධාන ග්‍රන්ථය සුශ්‍රැත ය. වාග්භට (ජ්‍යෙෂ්ඨ) විසින් සුශ්‍රැත හා චරක සංහිතා මනාව ගැලපීමෙන් සකස් කරන ලද අෂ්ටාංග සංග්‍රහය ආයුර්වේදය නමින් ක්‍රමානුකූල වෛද්‍ය විද්‍යාවක් ලොවට හඳුන්වා දුන්නේ ය. අෂ්ටාංග සංග්‍රහය වාග්භට (කණිෂ්ඨ) විසින් අෂ්ටාංග හෘදය සංහිතා නමින් කවියෙන් ලියන ලදි. මෙම ප්‍රාථමික මූලාශ්‍රය තුනෙහි ම ආයුර්වේදයේ අංග අට පැහැදිලිව ම දක්වා තිබේ. එනම්, කාය චිකිත්සා (General medicine or Internal medicine). ශල්‍ය තන්ත්‍ර (Surgery or major surgery). ශාලක්‍ය තන්ත්‍ර (E.N.T. Treatment minor surgery or opthalmology). භූත විද්‍යා හෝ ග්‍රහ චිකිත්සා (Psychiatry) කෞමාර භෘත්‍යය (Pediatrics coupled with Midwifery). අගද තන්ත්‍රය හෙවත් විෂ තන්ත්‍රය (Toxicology) රසායන තන්ත්‍රය (Tonics or geriatrics) සහ වාජීකරණ තන්ත්‍ර (Aphrodisiac medicine coupled with eugenics or knowledge of virilfics) වශයෙනි.

ඉහත සඳහන් ප්‍රධාන මූල ග්‍රන්ථ ත්‍රයෙහි ම භූත විද්‍යාව හෝ ග්‍රහ චිකිත්සා වශයෙන් එක් අංගයක් පැහැදිලි ව දැක්වේ. සුශ්‍රැත සංහිතාවේ උත්තර ස්ථානයෙ හි බාලයින්ට වැළඳෙන රෝග සුවපත් කරන ග්‍රහයින් නව දෙනෙකු ගැන සඳහන් වේ. මීට අමතර ව මිනිසාට ලෙඩ කරන භූතයින් ගැන ද සුශ්‍රැතයේ සඳහන්වේ. ඔවුන් අතර දෙවිවරු, අසුරයෝ, ගාන්ධර්වයෝ, පීතෘහු, භුජංගයෝ, රාක්ෂයෝ හා පිසාචයෝ වෙති. කයික් මනසින් වෙහෙස කරමින් ජීවත් වන පුද්ගලයින්ට මොවුහු ආවේශ වී ලෙඩ දුකට පමුණුවති. මොවුන් මිනිසුන් දුකට පමුණුවන නියමිත දින සහ වේලාවල් ඇත. මොවුන් සුව කිරීමට නම් දක්ෂ වෛද්‍යවරුන් ලවා මන්ත්‍ර ජප කිරීම, යාග හෝමාදිය කිරීම කළ යුතුය. යාග හෝම සඳහා ඔවුන්ට නියමිත පූජා ද්‍රව්‍ය මේ අන්දමින් ස්වභාවෝපරි රෝග (Supernatural diseases), ඒවායේ ප්‍රභවය හා චිකිත්සා ක්‍රමය (Therapeutics) හඳුන්වනු ලබන්නේ භූත විද්‍යා නමිනි.





## 2. අරමුණු

පුද්ගලයකු තුන්දොස්, යක්දොස්, ප්‍රේතදෝෂ, භූතදෝෂ, ග්‍රහදෝෂ, දේවදෝෂ හා කර්මදෝෂ යනුවෙන් සත්වැදෑරුම් බලපෑම් මඟින් රෝගී භාවයට පත්විය හැකි බව ජනවෙදකමෙහි දැක්වේ. මෙය සිංහල වෙදකමෙ හි හෙවත් දේශීය චිකිත්සාවෙහි ද බෙහෙවින් අන්තර්ගත වූ කාරණයකි. මෙහි ප්‍රාථමික අවස්ථාව ලෙස ගිනිය හැක්කේ පෞරාණික ආයුර්වේද මූල ග්‍රන්ථ වල සඳහන් අශ්ටාංගයෙ හි (Octopartite) භූත වෛද්‍ය විද්‍යාවයි. මෙම කොටස වර්තමාන ආයුර්වේද වෛද්‍යා අධ්‍යාපනය තුළින් ක්‍රමානුකූල ව බැහැර වී ගොස් ඇති බව පෙනේ. එමෙන්ම විද්වතුන්ගේ අවධානය ද, බෙහෙවින් අඩු ක්ෂේත්‍රයක් වී තිබේ. නමුත් රාවණ යුගයේ සිට පැවත එන දේශීය වෛද්‍ය ක්‍රමය තුළ තවදුරටත් භූත වෛද්‍ය විද්‍යාවේ අඩංගු දෑ ප්‍රායෝගික ව අත්විඳිය හැකි බව පෙනේ. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාවෙ හි මූලික පරමාර්ථය වන්නේ අෂ්ටාංග ආයූර්වේදයේ එන භූත විද්‍යාව පිළිබඳ විමර්ශනයක යෙදීමයි. එමෙන්ම සුවිශේෂී අරමුණු ලෙස එහි වපසරිය සැකෙවින් හඳුනාගැනීමත් වත්මන් සමාජය තුළ ප්‍රකට ව හෝ නිළීන ව ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කර ගැනීමත්, දේශීය වෛද්‍ය ක්‍රමය ට යම් සහසම්බන්ධතාවක් ඇත් දැ යි සොයා බැලීම මෙන් ම ශාන්තිකර්ම පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමත්‍ය.

## 3. මූලාශය හා ක්‍රමවේදය

උක්ත ප්‍රස්තුතය සම්බන්ධ දත්ත ඒකරාශී කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රය (Primary sources) මෙන්ම ද්විතීයික මූලාශ්‍රය (Secondary sources) වශයෙන් දෙයාකාරයෙන් ම භාවිතයට ගන්නා ලදී. ලිඛිත මූලාශ්‍රය (Literary sources) මඟින් දත්ත ඒකරාශී කිරීමේදී, ලිඛිත ප්‍රාථමික මූලාශ්‍රය ද, ලිඛිත ද්විතීයික

මූලාශ්‍රය ද පරිශීලනය කරන ලදී. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව දැනුමැති දත්ත දායකයින් (Key informants) ගෙන් තොරතුරු දීර්ඝ කාලයක් තිස්සේ ඒකරාශී කරන ලදී. එම දත්ත ඒකරාශී කිරීම සඳහා බෙහෙවින් ම යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡාවයි. එමෙන්ම විවිධ ශාන්තිකර්ම නිරීක්ෂණය කිරීම සඳහා සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය භාවිතා කරන ලදී. මේ සඳහා ශාන්තිකර්ම කරනු ලබන දේවාල හතරක් යොදා ගන්නා ලදී.

## 4. භූත විද්‍යාව

භූත විද්‍යාව (Psychiatry) යනු අෂ්ටාංග ආයුර්වේදයේ එක් අංගයක් ලෙස හැඳින්වෙන බව ඉහතින් සඳහන් කරන ලදී. වෛද්‍යවරයාට ඖෂධ වලින් සුව කළ නොහැකි රෝගීන් භූත වෛද්‍යවරයා යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රයෙන් සුව කරනු ලැබේ. අෂ්ටාංග ආයුර්වේදයේ ආතුරයාගේ ලෙඩ දුක් නසන ප්‍රතිකාර කොටස් තුනකට බෙදා දක්වා ඇත. එනම්; දෛව ව්‍යප්‍රාශය, යුක්ති ව්‍යප්‍රාශය සහ සත්වාද්වජය යනුවෙනි. දෛව ව්‍යප්‍රාශය චිකිත්සා ක්‍රමයේදී යම් පුද්ගලයකුට ඇති වන යක්ෂ, භූත, පිසාච, ප්‍රේත, කුම්භාණ්ඩ ආදියෙන් වන්නාවූ දෝෂ, ඇස්වහ, කටවහ, හෝවහ, හදිහූනියම් දෝෂ. රවි, සඳු, කුජ, බුධ, ගුරු, කිවි (ශුක්‍ර), ශනි, රාහු, කේතු යන ග්‍රහයින්ගෙන් වන්නා වූ අපල, උපද්‍රව, කල්කර්ම, අකල්කර්ම මඟින් හටගන්නා රෝග, දෝෂ ආදිය සඳහා ශාන්තිකර්ම හා වෙදහෙදකම් කිරීමේ අංගයයි (ලියනගේ,2001). යුක්ති ව්‍යප්‍රාශය යනු ඖෂධ හා ආහාර මඟින් රෝග සුව කිරීමයි. සත්වාද්වජය යනුවෙන් දක්වා ඇත්තේ මානසික ව ඇතිවන උන්මාද, අපස්මාර යන රෝගයන් සඳහා කරනු ලබන ප්‍රතිකාර ක්‍රමය යි (සීලරතන හිමි,2005).

'භූත' නම යක්ෂ සේනාවකි. මෙම සේනාවේ යකුන් කෙළ ලක්ෂයක් ඇතැයි කියනු ලැබේ. මොවුන් ආරෝධ සෙනෙවියා





යටතේ වන අතර, වෛශ්‍රවණගේ ආඥාචක්‍රයට යටත් ව සිටිති යි පිළිගැනේ. භූතයින් වශයෙන් (අමනුෂ්‍ය), යක්ෂ, රාක්ෂ, භූත, කුම්භාණ්ඩ, පිසාච, අසුර හා නාග යන කොටස් රාශියක් ඇතැ යි සැලකේ. 'භූත නායක' හෙවත් 'භූතේෂ්වර' ලෙස සැලකෙන්නේ ශිව දෙවියෝ ය. 'භූතාධිපති' ලෙස සැලකෙන්නේ පංච මහා භූතයින්ගේ අධිපතියෝය. එනම්, ධාතු ගුණයට අධිපතියෝ ය. ඒ අනුව, පඨවි-බුධ, ආපෝ-සිකුරු, තේජෝ-අඟහරු හා වායෝ-ශනි යනාදී වශයෙනි. ජ්‍යොතිෂ්‍යයේ දී 'භූත පොරොන්දම' පොරොන්දම් ප්‍රභේදයෙන් එකක නාමයකි. ස්ත්‍රී, පුරුෂ දෙදෙනා ගේ නැකැත් බෙදෙන පංචවිධ ප්‍රභේදය අනුව මෙය සලකනු ලැබේ. දෙදෙනා එකම භූත ගණයට අයත් වීම සුභ බවත්, ආපෝ, තේජෝ භූත දෙකට අයත් වීම අසුභ බවත් එසේ නොවීම සම බවත් කියනු ලැබේ (පෙරේරා, 2007).

ආයුර්වේදයෙ හි අන්තර්ගත භූත විද්‍යාව යළි අංග අටකට බෙදීයයි (කුමාර,2011). මෙම විද්‍යාවන් පහළ වූයේ කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයටත් පෙර සිටි ඍෂිවරුන් දස දෙනෙකුගේ (ඇතැම් තැනක නව දෙනෙකු) ශිල්ප ශාස්ත්‍ර අනුව බව ප්‍රකාශ වේ. මෙම ඉසිවරුන් දස දෙනා පොළවේ සිට ම ඉර, සඳ අතගෑමට හැකි ඍද්ධි බලයක් තිබූ ඉසිවරු බව කියයි. නමින් අශ්ටක, වාමක, වාමදේව, භගු, යවචතග්ගී, වාසෙට්ඨ, කාශ්‍යප, භාරද්වාජී, වෙස්සමිත්ත සහ අංගීරස නම්වේ. මේ ඍෂිවරුන්ට අතීත මහා කල්ප හතළිහක්ද, අනාගත මහා කල්ප හතළිහක් ද, දිවැසින් පෙනෙන මහා බලයක් තිබූ උතුමෝ යැ යි කියති. විවිධ ක්ෂේත්‍රයන් ට වෙන්කර ඇති මෙම ශාස්ත්‍රය සුභ කටයුතු මෙන් ම අසුභ කටයුතු ද කළ හැකි සේ සකස් කොට ඇත. මෙම ඍෂිවරුන්ගේ දැනීමෙන් සොයාගත් මන්ත්‍ර විද්‍යාව ලක්ෂ ගණනක මන්ත්‍ර තිබුණා යයි විශ්වාස කෙරේ. ඒවා ලක්ෂයකට අලගු මන්ත්‍රයක් ද ඇත. එබැවින් අලගු මන්ත්‍ර නමින් විවිධ ක්‍රමවේදයන් පොත්වල ලියවී ඇත. භූතයන් අඩංගු කිරීමත් මේ විද්‍යාවේ එක කොටසකි. භූතයෙකු අඩංගු කිරීමට ඇප නූල් දැමීමේ සිට පිදේනි තවු දීම, නූලකට භූතයා අඩංගු කර ගැනීම, බන්ධනය කර ගැනීම ආදී ක්‍රමයන් ද වේ.

භූතයන් පාලනය කරන්නේ නායක වෙසමුණි දෙවියන් (කුවේර) විසින් බව විශ්වාස කරන අතර, එම මන්ත්‍ර කියවන විට භූතයා ඇවි පිළිස්සියන බවත් පිළිගැනේ. වෙසමුණි රජු නවමහා නිධියේ හිමිකරු ලෙස ද සැලකේ. එබැවින් මොහුට දිනිසුරු (ධනේෂ්වර) යනුවෙන් ද නමකි. සිරුර විරූපිය. අංගවිකලය. පාද තුනකි. එක් පාදයක් කොර ය. අත් දෙකකි. දත් අටක් දක්නට ඇත. සිරුර සුදු ය. රන්, මුතු, මැණික්, ආභරණ පළඳී. ඔහු වාසය කරන්නේ හිමවත කෛලාසයේ හි අලකා නම් පුරයෙහි විශාල උයනක ඇති මාළිගාවක ය. විශ්‍රවස් කුවේරගේ පියාවේ. මොහුගේ ආයුධය ගදාවයි. සතුරෙකුට දමා ගැසූ විට සතුරාගේ ඇගේ වැදී ආපසු තමා වෙත ඒමේ ශක්තිය එයට ඇතැයි පැවසේ (මහේන්ද්‍ර, 2003).

වෙසමුණි දේවතාවුන්ගේ අණ පරිදි අටවිසි යක්ෂ සෙනෙවියෝ මෙ යක්ෂයින්, භූතයින් උතුරුකුරු දිවයිනට භාර කරන බව කියති. මහාමේරු පර්වතයට උතුරු දිශාවේ උතුරුකුරු දිවයිනේ ආධිපත්‍ය දරමින් මහා යක්ෂ සේනාධිපතින්ට අධිපති වෛශ්‍රවණ දිව්‍යරාජයා ඉන්ද්‍ර, සෝම, වරුණ, භාරද්වාජ, පජාපති, චන්දනකාමසෙට්ඨි, කින්නුඝණ්ඩු, නිඝණ්ඩුපනාද, ඕපමඤ්ඤ, දේවසූත, මාතලි, චිත්තසේන, ගන්ධබ්බ, නල, රාජ, ජනේසභ, සතාගිර, හේමවත, පුණ්ණක, කරතිය, ගුල, සීවක, මුචලින්ද, වෙස්සාමිත්ත, යුගන්ධර, ගෝපාල, සුප්පගේධ, හිරිනෙත්ති, මන්දිය, පඤ්චාලචණ්ඩ, ආලවක, පර්ජුන්නසුමන, සුමුඛ, දධිමුඛ, මාණිමානිචර, දීඝ යන මහා යක්ෂ සේනාධිපතීහු පිරිවරා සිටිති යි විශ්වාස කෙරේ. මෙම දිව්‍යරාජයා ට අයත් අහසේ මවන ලද සුවිසාල නගර තිහිපයකි. ආටානාටා, කුසිනාට, පරකුසිනාටා, නාටපුරියා, පරිකුසිතනාටා, යන අහසේ මාළිගාවෝ ය. තව ද වෙසමුණි රජුට උතුරෙන් කපීවන්ත නම් නගරයකි. දකුණෙන් ජනෝඝ නම් නගරයකි. නවනවතී, අම්බර, අම්බරවතී, ආලකමන්දා, විසාණ නම් රාජධානි ද ඇත. ඔහුට තතෝලා, තත්තලා, තතොතලා, ඕජසී, තේජසී, තතොජසී, සූර, රාජ, සූරරාජ, අරිට්ඨ, නේමි, අරිට්ඨනේමි ය යි තොරතුරු සපයන බලවත් පිරිසක් ද සිටිති.





විසාණහි රමණීය විලක් ඇත. එම විල මැද භගලවතී නැමැති මනස්කාන්ත රැස්වීම් ශාලාවකි. සියලු යක්ෂ සේනාධිපතීන් රැස්ව යක්ෂ සමාගම පවත්වනු ලබන්නේ මෙහිදී ය. මෙම විල්තෙර අවට ද ඉතා සිත් ගන්නා පරිදි සදාකල්හි ම ඵලබරින් පිරුණු තුරුලතාවන්ගෙන් සමන්විත විවිධ මනෝහර කුරුලුනාද සහිත කොවුල් පීවං පීවක (පීවං පීවං යැයි) නාද කරන්නේය. රන් රුවන් වසුදඬු රාවයෙන් පිරුණු ඉතා රමණීය කුරුලු නාදයන්ගෙන් විසිතුරු ය. ඉන්ද්‍ර නම් ලත් පුත්‍රයෝ අනූඑක් දෙනෙක් වෛශ්‍රවණ දෙවියන් ට සිටින බව මූලාශ්‍රයෙහි දැක්වේ. එමෙන් ම වෙසමුණි මාලාව නොහොත් හස්ථ කර්ණයේ සඳහන් පරිදි වෙසමුණි දෙවිරජුන්, තුන් ගව්වක් උස ඇති ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ ඔටුන්න සිරසේ දරාගෙන දොළොස් ගව්වක් පමණ දිග නීලපට දරපු දිව සළුවක් ඇඳගෙන, කනට මාණික්‍යමය වූ සැට ගැලක් පුරාලන ලද දිව්‍ය ආබරණ පැළඳගෙන යෙල සියක් යොදුන් උස ඇති තුරඟ වාහන පිට නැගී, චන්ද්‍ර මණ්ඩලාකාර පළිහක් වමතින් දරාගෙන ගව්වක් දිග ඇති වීදුරු කඩුවක් දකුණු හස්තයෙන් දරාගෙන එක් ලක්ෂ හැට අට දහසක් යොදුන් උස ඇති මහමේරු පර්වත රාජයාගේ චතුර්වර්ණ ගත වූ සතර දිග්භාගයට අයත් උතුරු දිග්භාගයේ මෙම දිව්‍යරාජයා වැඩ වාසය කරන බව විශ්වාසයේ පවතී.

## 5. භූත විද්‍යාවට අයත් අෂ්ටකර්මය

අංග අටකින් කොටස් කර විග්‍රහ කෙරෙන භූත විද්‍යාව ග්‍රහ අපල සඳහා යන්ත්‍ර පැළඳවීම, ලෙඩ රෝග සුව කර ගැනීම සඳහා ශාන්තිකර්ම කිරීම, යක්ෂ, ප්‍රේත, භූත දෝෂ ඉවත් කිරීමට, හදි හූනියම් දෝෂ ඉවත් කිරීමට, ගෙවල් දොරවල් ආරක්ෂා කිරීමට, බහිරව පූජා පැවැත්වීම, රාජවශී යන්ත්‍ර පැළඳවීම, ව්‍යාපාර දියුණුවට වැඩකටයුතු කිරීමාදී හොඳ වැඩ ද, වශී ගුරුකම් පවුල් කඩාකප්පල් කිරීම ආදී දෙය ද, හදි හූනියම් කිරීම ආදී නොකළ යුතු වැඩ ද ආදී සියලු යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පොදුවේ භූත විද්‍යාව

ට අයත් වේ. එම අෂ්ටාංගය මෙහිදී සංක්ෂිප්ත ව විග්‍රහ කෙරේ (ලියනගේ, 1996).

1. වශීකර්ම

පුද්ගලයින්ගේ සිත් දිනාගැනීම සඳහා සිදු කරනු ලබන මන්ත්‍ර කර්ම වශීකර්ම ගණයට වැටේ. වශීකර්ම වල සරල ම කොටස ලෙස සැලකෙන්නේ මලකට, රසකැවිල්ලකට, නූලකට මැතිරීම වැනි දේය. රසකැවිල්ලක් නම් අදාළ, අවශ්‍ය පුද්ගලයා ට කෑමට සැලැස්වීම, නූලක් නම් අවශ්‍ය අයට යටිපතු කිරීම, මල නම් දීම හෝ යටිපතු කිරීම සිදුකරනු ලැබේ. මීට එහා ගිය සංකීර්ණ වශීකර්ම ද පවතී. සතුරන් මෙල්ල කිරීම, ව්‍යාපාර හෝ නිවාස දියුණුව, සම්මුඛ පරීක්ෂණය මෙන් ම නඩුහබ වලින් ජය ගැනීමට, අඹු සැමියන් විරසක නැතිවී ආදරය, කරුණාව, වර්ධනයවීමට මෙය ප්‍රයෝජනයට ගනු ලැබේ.

වශී කර්ම සිදු කිරීමේදී ඊට අදාළ දිසාව වන ගිණිකොණ දිශාව ගනු ලැබේ. වශී කර්මය ට අයත් නැකැත් වන පුවපුටුප, පුනාවස, අභිජිත් නැකැත් වලින් එකක් යෙදෙන දිනෙක මෙම වශීකර්මය කළ යුතු යයි පිළිගැනේ. එමෙන් ම මෙයට නියමිත දිනය වන්නේ සිකුරාදා ය. අෂ්ටකර්ම කටයුතු වලදී නියමිත වේලාවන් ද ඇති බැවින්, දිවා රත්‍රි හයත් දහයත් (6-10) අතර කාලය යොදාගත යුතුය යි සැලකේ. මෙම කර්මය ට අධිපති දේවතාවෝ වන්නේ රතිකාම දේවතාවෝ සහ සරස්වති දේවතාවයි. පූජා ද්‍රව්‍ය ලෙස විශේෂයෙන් ගනු ලබන්නේ සමන්පිච්ච මල්, කනේරු මල් මෙන්ම එළකිරි, දීකිරි, මීකිරි, ගිතෙල්, වෙඬරු, මී පැණි, උක්සකුරු ආදිය යි. ඇදුරුතුමා තද රතු පැහැති වස්ත්‍රයෙන් සැරසී ඔයක්, ගඟක්, වැවක් වැනි ස්ථානයක, ඉවුරක මෙම වශීකර්මය සිදුකළ යුතුය යි දක්වේ.

2. ආකර්ෂණ කර්මය

මෙ මඟින් වෙළහෙළඳාම් කටයුතු ආදිය වර්ධනය කොට දියුණු කිරීම, අස්වැන්න වැඩි කිරීම, හැරගිය අය ගෙන්වා ගැනීම, ධනය වැඩිකර ගැනීම, ජනයා ඇද ගැනීම සඳහා සර්ව ජන වශීකර්ම,





යන්ත්‍ර මන්ත්‍ර වලට දිෂ්ටි කිරීම, මෙන් ම රුවටීම, මුලා කිරීම හා ඇස් බැන්දුම ක්‍රියා මීට අයත් වන බව පැවසේ. ආකර්ෂණ කර්ම සඳහා ද සුදුසු දිනය ලෙස සැලකෙන්නේ සිකුරාදා ය. තෝරාගත යුතුය යි සලකනු ලබන නැකැත් වන්නේ බෙරණ, පුවපල් සහ පුවසල ය. ඇදුරුතුමා රතු පැහැති වස්ත්‍රාභරණ වලින් සැරසී උතුරු දිසාවේ සිට දිවා රාත්‍රී දහයත් දොළහත් (10-12) අතර කාලය තුළ කිරිගසක් මුල මෙම කර්මය සිදුකළ යුතුයයි පිළිගැනේ. අෂ්ටකර්ම සිදුකරන වේලාව එදින ඉර උදාව අනුව සංශෝධනය විය යුතු බව ද දක්වේ. ආකර්ෂණ කර්මයට අධිපති දේවතාව වන්නේ ද සරස්වතී දේවියයි. එතුමිය පිදීම සඳහා අරලිය මල් මාලයක් මෙන් ම පුවඟු, කැලෑමල් ආදිය ද, කරදමුංගු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ඉඟුරුපියලි ආදී සුවඳ වර්ග යෙදූ පූජාවක් සකස් කරගතයුතු බව ද වැඩිදුරටත් සඳහන් කෙරේ.

3. මෝහණ කර්මය

මෙහිදී ඉන්ද්‍රජාල, විජ්ජා, මෝහනයකිරීම, රුවටීම, මුලා කිරීම, ඇස්බැන්දුම් ක්‍රියා මෙන් ම තාවකාලික ව තමන්ට යටත් කර ගැනීම සිදු කෙරේ. මෙහි දී මෝහිණී දේවිය මෙන් ම සරස්වතී දේවිය ද අධිපතිත්වය අරණ බව පිළිගැනේ. සුවණ, රෙහෙන, හත යන සඳුගේ නැකැත් යෙදෙන සඳුදා දිනයක බටහිර දිසාවේ සිට ලා රතුපාට වස්ත්‍රාභරණයෙන් සැරසී දහවල් දොළහත්, දෙකත් (12-2) අතර කාලයේ දී මල් පිපුන මනරම් උයනක් බඳු ස්ථානයක මෙම කර්මය සිදුකළ යුතුය යි විශ්වාස කෙරේ. ඇතැමුන් මෙම පීවම් කිරීම බටහිර දිශාවේ නොව නිරිතදිග දිශාවේ කළයුතු යයි ද ඇතැම් ගුරුකුල වල සඳහන් වන බව කියයි. මේ සඳහා පූජා ද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ කළු උක්ගස්, තල, සූකිරි, කංසා, අබිං, කළු අත්තන ඇට යොදා සකස් කරන ලද පූජාවක් ය.

4. ස්ථම්භන කර්මය

මෙම කර්මයේ දී අවි ආයුධ වලින් වන්නා වූ අනතුරු වළක්වාගැනීම, අකුණු සැර ආදිය වළක්වා ගැනීම, සතුරු බලවේග නොපැමිණීම, ගිනි සිසිල (අග්නි ස්ථම්භය), ජලය යට හුස්ම අල්ලා

සිරීම (ජල ස්ථම්භය) මෙන් ම, වෙඩි හිර කිරීම, බන්ධනක්‍රියා, නැකිරීම, සතුන්ගේ මුඛ බන්ධන, බෙර, රබන් පැලීම, ආදිය සිදු කිරීම ආදියෙන් විවිධ ස්ථම්භන කර්ම රැසක් සිදු කරනු ලැබේ. මෙම කර්මය ට අධිගෘහිත දේවතාවා වන්නේ ශ්‍රියා කාන්තාව හෙවත් ලක්ෂ්මී දේවිය යි. ඇතැමුන් පාර්වතී දේවිය ද අධිපති දේවිය ලෙස පිළිගනු ලැබේ. අදාළ දිනය බදාදා වන අතර, දෙට, අස්ලිය, රේවතී, මූල යන නැකැත් යොදාගනු ලැබේ. අදාළ දිශාව නැගෙනහිර වන අතර, ලා රතුපාට (ඇතැම් තැනෙක කහපාට) වස්ත්‍රාභරණයෙන් සැරසී, බෙලි, කෙසෙල් සහිත පළතුරු පූජාවක් දහවල් හෝ අළුයම දෙකත්, හයත් (2-6) අතර කාලයේ දී පොල්කොළ, තලකොළ, ඉලුක්, මානා යන කොළ වර්ග මිශ්‍ර පැදුරක වෙල් එළියේ සිට පිවම කළ යුතු යයි පිළිගනු ලැබේ.

5. විද්වේෂණ කර්ම

මෙහිදී ඡේදන කටයුතු ලෙස සැලකෙන පවුල් භේදකිරීම, වෙන්කිරීම, වෛරකරවීම, සතුන්ට දඬුවම් දීම, නුරුස්සනා ගති ඇති කරවීම ආදිය සිදුකරනු ලැබේ. මෙය පුද්ගලයාට අයහපත සිදු කිරීම සඳහා සිදු කරනු ලබන අතර, විද්වේෂණ කර්ම සිදු කිරීම මරණින් මතු රෞරව නරකයේ ඉපදීමට හේතුවන අකුසලයක් බව ද, දක්වේ. දෙනට, මුවසිරස, සිත හා කැති නැකැත් ඇති කුජට අයත් අඟහරුවාදා දිනෙක මූ දේවිය (ඇතැම් තැනෙක උමා දේවිය) උදෙසා, නිරිතදිග දිසාවේ, රන්වන් පාට වස්ත්‍රාභරණයෙන් සැරසී දිවා රාත්‍රි දහයත්, දොළහත් (10-12) අතර කාලය තුළ සොහොන් පිටියක මෙම මැතිරීම සිදුකළ යුතු යයි පිළිගැනේ. මේ සඳහා නිර්දේශිත පූජා ද්‍රව්‍ය වන්නේ, රතුමල්, කුකුල් කකුලෙන් ගත් රුධිරය, මී හරක් සම, බකමූණු හිස, සුරුට්ටු හා කුණු මස් ආදියයි.

6. උච්චාටන කර්ම

මේ මඟින් පළවාහැරීම, විත ආපිට කැපීම, ගෙවල්-දොරවල්, වතුපිටි ආරක්ෂා කිරීම, සර්පයින් පැන්නීම, අංජනම් බැලීම,





අංගම, පිල්ලි ආපසු හැරවීම ආදිය කරනු ලැබේ. මීට අමතරව පුද්ගලයා වෙත බන්ධනය කර ඇති අද්භූත බලවේග, පළවා හැරීම, සුව නොවන රෝග පීඩා සොයාදීම හා ඒවාට යම් සහන උදාකරදීම මෙමඟින් සිදු කරන බව ඇදුරෝ පවසති. භූත විද්‍යාව පිළිබඳ දැනුමැති අය, මෙම උච්චාටන කර්ම තම දැනුම භාවිත කර සුභ පැත්තට සිදුකරයි නම් එය දෙලොවට ම වැඩදායක පිණිස පවතින්නේ යයි පිළිගැනේ. උච්චාටන කර්ම සිදු කිරීමට සුදුසු දිනය ලෙස ශනි ට අයත් සෙනසුරාදා ගැනෙන අතර, අද, සියාවස සහ සා යන රාහුගේ නැකැත් යොදා ගත යුතු ය යි ව්‍යවහාරයේ පවතී. මෙය සිදු කිරීමේ දී දුර්ගා දේවිය උදෙසා කිරීම අනිවාර්ය වේ යයි සැලකෙන අතර, දිවා රාත්‍රී දොළහත්, දෙකත් (12-2) අතර කාලය තුළ සිදුකළ යුතු යයි පිළිගැනේ. ඇදුරුතුමා අළු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී වයඹ දිශාවේ සිට, අපිරිසිදු ස්ථානයක හිඳ මැතිරීම කළ යුතු යයි සැලකේ. මෙහි දී ඇට ඇටි, පුළුටු සහිත ගොඩ මස් දියමස්, හත් මාළුව සහ මිය ගිය කපුටෙකුගේ පිහාටු ද සහිත ව පූජාව තැබිය යුතු ය යි විශ්වාස කෙරේ.

7. මාරණ කර්මය

මේ මඟින් දුෂ්ටයින්, සතුරන් වැනසීම, අනවින, කොඩිවින කිරීම, අගනා හූම් පාළු කිරීම (හූම් පාළු), අංගං, කාලං, පිල්ලි යැවීම, යක්ෂ බන්ධන ආදිය සිදු කළ හැකි යයි විශ්වාස කෙරේ. මෙම අවර ගණයේ කර්ම සිදුකළ විට භූමිය, ගේ දොර, ගහකොළ මැළ වී දිරාපත් වේ ය යි විශ්වාසයේ පවතී. එසේම කිසි දිනෙක සරු බගාවක් ඇති නොවේ ය යි පිළිගැනෙන අතර, භූමිය වඳ වී, පාළු වන බව පවසති. මෙවන් අවර ගණයේ කර්ම සිදු කිරීම තිවන් දකිනා ජාති දක්වා ම විපාක දිය හැකි අකුසල කර්මයක් විය හැකි බව ද බෙහෙවින් විශ්වාසයේ පවතී. මෙම මරණ කර්ම සඳහා භද්‍රකාලී අධිපතිත්වය දරනු ලැබේ. ශනි (සෙනසුරු) ගේ නැකතක් යෙදෙන දිනෙක පුෂ, අනුර, උත්‍ර පුටුප, අස්විද සහ මා යන නැකතකින් සෙනසුරාදා දිනෙක රාත්‍රී දෙකත්, පාන්දර හයත් (2-6) අතර වේලාවේ සෙහොනක, අලුත වළදාන ලද මිනී වළක් ළඟ හෝ උඩ සිට මැතිරීම් කළයුතු ය යි විශ්වාසයේ පවතී. දකුණු

දිශාවේ සිට කළුපාට වස්ත්‍රාභරණයෙන් සැරසී, රතුමල්, නරකෙස්, මිනී ඇළ, මිනී ඔළු සහිත සීනි පූජාවක් ලෙස සකසා දිය යුතු ය යි විශ්වාසයේ පවතී.

8. අෂ්ටකර්මයට ඇතුලත් ශාන්තිකර්මය

අෂ්ට කර්මය පිළිබඳ දැනුවත් වුව ද, ශාන්තිකර්ම හා සුභ පැත්තට කරන 'උච්චාටන කර්ම' හැර අනෙකුත් අයහපත් කර්ම කිසිවක් නොකළයුතු බව ව්‍යවහාරයේ පවතී. අෂ්ට කර්ම වලින් ජනයාගේ හිතසුව පිණිස පවතින වැදගත් ම කර්මය 'ශාන්තිකර්මය' ලෙස පෙන්වාදිය හැකිය. මෙමඟින් පුද්ගලයින්ට ශාන්තිකර්ම කිරීම සඳහා භාවිත කරනු ලබන සියලු යන්ත්‍ර මන්ත්‍ර මෙයට අයත් වේ. ලෙඩ රෝග සුවපත් කිරීම, යක්ෂ, භූතදෝෂ, පිසාචාදී අමනුෂ්‍යයින්ගෙන් පැමිණෙන උවදුරු, ග්‍රහ දෝෂ, බාලගිරි දෝෂ, ඇස්වහ, කටවහ, හෝවහ දෝෂ, වින දෝෂ දුරු කිරීම, යාග, හෝම, බලි, තොවිල් කිරීම, දෙහි කැපීම ආදී බොහෝ පුද්ගලයාගේ යහපත පිණිස කරනු ලබන කර්ම මීට ඇතුලත් වේ. මෙම ශාන්තිකර්ම වලට ද සරස්වතී දේවිය (ඇතැම් තැනෙක පාර්වතී) අධිපතිත්වය දරනු ලැබේ. උත්‍රපල්, උත්‍රසල, විසා යන නැකැත් යෙදෙන ඉරිදා දිනෙක, ඊසාන දිශාවේ සිය පූජා කටයුතු කළයුතු ය යි අවධාරණය කෙරේ. ඇදුරුතුමා කහ පාට හෝ සුදුපාට වස්ත්‍රාභරණයෙන් සැරසී, දිවා රාත්‍රී හයත්, දහයත් (6-10) අතර මැතිරීම් කළයුතු ය යි පිළිගැනේ. මෙහිදී පූජා ද්‍රව්‍ය ලෙස මල්වර්ග පහක්, බුලත්, තැඹිලි, අග්ගලා, තල, අලුවා සහිත ව කැවිලි වර්ග පහක් ආදිය වෙසෙසින් ම යොදා ගැනේ. සුවඳ දුම් වර්ග පහක් හා පස් තෙල් ද මේ සඳහා යොදා ගැනේ. මෙම පූජාවන් සහ මැතිරීම් විහාර ස්ථානයක් අශ්‍රිතව සිදු කිරීම වඩා යෝග්‍ය ය යි සැලකේ. මෙම පූජාව ශ්‍රියා කාන්තාව උදෙසා කරන බව ද ඇතැම් මූලාශ්‍රය වල සඳහන් වේ.

පොදුවේ 'දෛව ව්‍යාප්‍රාශය චිකිත්සාව' වශයෙන් හඳුන්වනු ලබන. ශාන්තිකර්ම ප්‍රධාන සම්ප්‍රදායන් තුනකට වර්ගීකරණය කොට තිබේ. එනම්;





i. දේව ශාන්තිකර්ම
ii. යකුන් තොවිල්
iii. ග්‍රහ ශාන්තිකර්ම වශයෙනි (සීලරතන හිමි;2005).

විවිධ රෝ දුක්, ව්‍යසන, දුක්ගැහැට වලට කායික ව බෙහෙත් කළ ද, පියවි ඇසට නොපෙනෙන බලවේග රැසක් මේ විශ්වය පුරා ගමන් කරන බැවින් ඒවා සුවවන්නේ නැතැ යි විශ්වාසයේ පවතී. එම බලවේග පුද්ගලයින්ගේ ජීවිතයට නොයෙක් අයුරින් බලපාතු ඇතැ යි පිළිගන්නා අතර, ඔනෑම කෙනෙකුට ඉහත කී බලවේගයක අවේශවීම හෝ යටත් වීමක ට හැකියාව පවතී යයි ඇදුරෝ පවසති. එම නිසාවෙන් යම් යම් රෝගී තත්ත්වයන් හටගන්නා අතර, ඉහත ශාන්තිකර්ම ඇදාළ පරිදි කළයුතු වේ. ඉහත සංකල්පයන් සැකෙවින් සාකච්ඡා කිරීම වැදගත් වේ.

i. දේව ශාන්තිකර්ම

විෂ්ණු පුරාණය, ස්කන්ධ පුරාණය, පද්ම පුරාණය ආදී පුරාණ වලට අනුව දෙවිවරුන් ඉතා බලසම්පන්න යයි සලකති. හින්දු බහුදේවවාදය (Polytheism) දේව වන්දනාව ට මුල් තැනක් ලැබේ. තිස්තුන් කෝටියක් දෙවි දේවතා සමූහය හින්දු විශ්වාස ඇදහිලි සමඟ එන්නකි. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ම දේව වන්දනාව තිබූ බව පැවසේ.බුදුදහම මඟින් ද දේව සංකල්පය ප්‍රතික්ෂේප කොට නොමැත. බොහෝ සූත්‍ර දේශනාවලත්, ධම්මපදයේත්, ජාතකට්ඨකථාවෙහිත්, දෙවි දේවතාවුන් පිළිබඳ විස්තර, දිව්‍ය ලෝක පිළිබඳ විස්තර, දිව්‍ය ලෝකෝත්පත්තිය පිළිබඳ විස්තර දක්වේ. බෞද්ධ වත් පිළිවෙත් අවසානයෙ හි දෙවියන්ට පින් අනුමෝදන් කිරීම බුදුන් වහන්සේ විසින් අනුමත කරන ලද්දකි.

උප සංස්කෘතික (Sub culture) ලක්ෂණ විදහා දක්වෙන ජන ආගම තුළ දෙවි දේවතා සංකල්පය පූර්ණ ලෙස අධ්‍යයනය කිරීම වැදගත් ය. ජන ආගමේ එන දෙවිවරු කොටස් පහකට බෙදා වෙන් කළ හැකි බව මහාචාර්ය නන්දසේන රත්නපාල පෙන්වා දේ (රත්නපාල, 1995). එනම්, හින්දු ආගමෙන් ලාංකේය

සම්ප්‍රදායට කෙලින් ම හෝ වක්‍රව ඇතුලු කරනු ලැබූ දෙවිවරු මූලික වෙති. දෙවනුව ග්‍රහ අපල සිදුකරන දෙවිවරුන් (Planetgods) වැදගත් වේ. ඊට අමතර ව සශ්‍රීකත්වයට මුල්වන පත්තිනි, ලක්ෂ්මී වැනි දේවතාවන් ජනයා අතර වන්දනාවට පාත්‍ර වේ. එමෙන් ම ලාංකේය ජන සමාජය තුළින් ම දේවත්වයට පත් වූ දෙවි දේවතාවුන් සහ ගම්වල ප්‍රාදේශීය වශයෙන් සලකනු ලබන දෙවිවරුන් පෙන්වා දිය හැකි ය.

ජන ආගම තුළ පුද පූජා වලට විශේෂයෙන් පාත්‍ර වන දෙවි දේවතාවෝ පස් දෙනෙකු සිටිති. මෙම දෙවිවරු නම් කතරගම, සමන්, විෂ්ණු, නාථ දෙවිවරුන් සහ පත්තිනි දේවතාවායි. මෙම දෙවිවරුන් ලංකාවේ සතරවරම් දෙවිවරුන් ලෙස ද සලකන බවත්, ලංකාවේ කන්ද උඩරට සහ පහතරට ප්‍රදේශ වල සතරවරම් දෙවිවරුන් අතර වෙනස්කම් පවතින බවත්, මහාචාර්ය බී.ජ්.වෙනිසන් පෙරේරා පෙන්වා දේ (මාගධී සඟරාව,2012). ඒ අනුව කන්ද උඩරට ප්‍රදේශයේ ආරක්ෂක දෙවිවරු සතරදෙනා වන්නෙ විෂ්ණු, නාථ, කතරගම හා පත්තිනි යන දෙවිදේවතාවෝ ය. පහතරට ප්‍රදේශයේ සතරවරම් දෙවිවරු ලෙස සලකනු ලබන්නේ විෂ්ණු, සමන්, විභීෂණ හා කතරගම යන දෙවිදේවතාවෝ ය.

බෞද්ධ සාහිත්‍යයේ ද ලෝකය ආරක්ෂා කරන සතරවරම් දෙවිවරු පිළිබඳ සඳහන් වේ. ඔවුන් සතරදිගට අධිපති ය යි සැලකේ. ඒ අනුව පෙරදිගට ධෘතරාෂ්ට ද, දකුණට විරුල්සාක (විරූඩ) ද, බටහිර ට විරූපාක්ෂ ද, උතුරට කුවේර (වෛශ්‍රවණ) ද වශයෙනි (චන්දිම හිමි, 2000). ඔවුන්ගේ වාසභවනය වන්නේ චතුර්මහා රාජිකයයි. පුණ්‍යකර්ම, වත්පිළිවෙත් අවසානයේ සතරවරම් දෙවියන්ට පින් අනුමෝදම් කිරීම චාරිත්‍රයකි (පීරිස්, 2007). දේව සංකල්පය ධුරාවලියකට අනුව සකස් වී ඇත. එහි ඉහළින්ම සිටින්නෙ 'දේවාති දේව' වශයෙන් සලකන බුදුන් වහන්සේය. අනතුරුව සතරවරම් දෙවිවරු, සතර දෙවිවරු, දිසා හා අඩවි භාර දෙවිවරු, ගම්භාර දෙවිවරු, අල්පේශාක්‍ය දෙවිවරු සහ යක්ෂ, ප්‍රේතාදීන් වශයෙනි (මාගධී, 2012).





ශාන්තිකර්මවල දී ඇතැම් දෙවිවරු යක්ෂ, දේව ස්වරූප දෙකෙන්ම පෙනී සිටිති. නිදසුන් වශයෙන් උපතින් යක්ෂයකු වන විභීෂණ දෙවියෙකි. සූනියම් පූර පක්ෂයට දෙවියෙකි. අව පක්ෂයට යක්ෂයෙකි. සතරවරම් දෙවියන්ගෙන් කෙනෙකු වන කුවේර යක්ෂ නායකයාය. දෙවිවරු 'කට්ටු' වශයෙන් පෙනී සිටිති. පත්තිනි සත්කට්ටුවකි. දෙවොල් දෙවි සත් දෙනෙකි. දෙවියක් කෝපවීම නිසා සිදු වෙතයි සලකන රෝග එනම්, සරම්ප, පැපොල, වසූරිය සහ කම්මුල්ගාය 'අම්මාවරුන්ගේ ලෙඩ ලෙස' හඳුන්වනු ලැබේ. මෙම දෙවි දූවරු සත් දෙනෙකි. ඔවුහු නම්, මහීකාන්තාව, මුදුමණිමේඛලාව, සරස්වතී, සීතාපරමේස්වරී, උමයංගනාව, වල්ලි අම්මා සහ පත්තිනි අම්මාය (ලියනගේ,1996). මෙහිදී පත්තිනි උදෙසා පුදනු ලබන පූජාවලදී වැදගත් තැනක් 'කිරි අම්මාවරුන්ගේ දානය' උදෙසා ලැබේ.

සියලු දෙවිවරුන් අතර විෂ්ණු දෙවිඳුට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එම දෙවිඳුට අන්වර්ථ නාම දාහක් (1000) ඇතැ යි පිළිගැනේ. විෂ්ණු භාර්යාව ශ්‍රීකාන්තාව හෙවත් ලක්ෂ්මී දේවිය යි. විෂ්ණු උපුල්වන් එක ම දෙවිකෙනෙකැ යි කියති. නිරංජනා ශාන්තිකර්මය විෂ්ණු දෙවියන් උදෙසා කරනු ලබන්නකි. නාථ දෙවිඳුන් උඩරට හා පහතරට ශාන්තිකර්මවල දී පුදලබන සතරවරම් දෙවිවරුන්ගෙන් කෙනෙකි. නාථ දෙවිඳුන්ට අවතාර අටක් ඇති බව පවසන අතර, මතු බුදුවන මෛත්‍රී බුදුරදුන් බව පිළිගැනේ. කතරගම දෙවි වේදයෙ හි සඳහන් දෙවි කෙනෙකි. සතියේ දින හතේ ම උදේ, දිවා. සවස මුරුතැන් පූජාව කතරගම දේවාලයේ පැවැත්වේ. වාර්ෂික පෙරෙහැර මංගල්‍යයන් තුනක් පැවැත්වේ. එනම්; අවුරුදු මංගල්‍යය (අලුත් සහල් මංගල්‍යය), ඇසළ මංගල්‍යය, සහ ඉල් මස කාර්තික මංගල්‍යය වශයෙනි. සුමන සමන් දෙවිඳු සබරගමු පළාතට, ශ්‍රීපාද අඩවියට අධිපති දෙවිඳු ය. පංකුවාමෘත පූජාව, පස් ගෝ රස, පානක, මුංබත, හබලපෙති, චතුමධුර, ත්‍රී මධු, අග්ගලා, කිරිබත, සත්කාර පුත්ත පැණි බත හා ඇඹුල් බත ආදිය විශේෂ පූජාය. සතරවරම් දෙවියන්ගෙන් කෙනෙකු ලෙස සලකනු ලබන විභීෂණ දෙවි රාවණ රජුගේ

සොහොඹුරෙක් සේ සැලකේ. විභීෂණ යනු 'බියකරු පෙනුමක් ඇත්තා' ලෙස විග්‍රහ කෙරේ.

ඊශ්වර නොහොත් ශිව දෙවියන් ත්‍රිමූර්තියට අයත් දෙවියෙකි. ලිංග පූජාවේ ආරම්භය ඊශ්වර දේව වන්දනාව තෙක් ඈතට දිවේ. වාර්ෂික ව මහා ශිව රාත්‍රිය ඊශ්වර දෙවියන් වෙනුවෙන් පවත්වනු ලබන අතර, නව රාත්‍රි පූජාව දුර්ගා දේවිය වෙනුවෙන් පැවැත්වේ. ගණ දෙවිඳු මෙරට බෙහෙවින් ම වන්දනාවට පාත්‍ර වන්නෙකි. දහඅට අවතාර නොහොත් මූර්තීන් දහඅටක් මඟින් ගණ දෙවියන්ගේ ගතිගුණ ද්වනිත කෙරේ. ගණ දෙවියන් වෙනුවෙන් ශාන්තිකර්ම, මන්ත්‍ර කර්ම, යන්ත්‍ර කර්ම යනුවෙන් තුන් ආකාර පූජාකර්ම සිදුකෙරේ. නුවරකලාවියේ 'කිරි ඉතිරුම් මංගල්‍යය' පුල්ලෙයාර් දෙවි උදෙසා පවත්වනු ලැබේ (චන්දිම හිමි,1990). කාලිමාතා දෙවඟන ඊශ්වර භාර්යාව සේ සලකනු ලබන අතර, අවතාර අහඅටකින් (18) ඉපිද ඇති කාලි 'විනාශයේ දෙවිඳුව' ලෙස ද සැලකේ. කාලිමාතාවට කරනු ලබන පුදපූජා, වත්පිළිවෙත්, පහන් දැල්වීම, ස්තෝත්‍ර, දෑහැන් ආදිය කිම හින්දු පුදපූජා, සම්ප්‍රදායට අයත් වේ. ඒවා කුමන ආකාරයකින්වත් බෞද්ධ ආමිස පූජා නොවන බව මහාචාර්ය නන්දසේන රත්නපාල පෙන්වා දේ (රත්නපාල,1995). දෙවිදේවතාවුන් අතරෙන් චිර ප්‍රසිද්ධ දේවතාවන් දෙදෙනෙකු ලෙස ලක්ෂ්මී දෙවඟන සහ සරස්වතී දේවිය පෙන්වාදිය හැකි ය. ලක්ෂ්මිය ලෝ වැසියන්ට සෞභාග්‍ය උදා කිරීමට ජනිත වී ඇතැ යි පිළිගැනේ. සරසවි දේවිය, වාග් දේවිය යනුවෙන් ද සැලකෙන අතර, ශිල්ප ශාස්ත්‍රයන් ට අධිපති දෙවඟන වේ. මහා බ්‍රාහ්මයාගේ භාර්යාව බැවින් ඇය 'බ්‍රහ්මණී' ද වේ.

ප්‍රාදේශීය මට්ටමෙන් විශාල කාර්යභාරයක් ඉටුකරන දෙවියකු ලෙස දැඩිමුණ්ඩ දෙවි වැදගත් තැනක් ගනියි. මෙම දෙවිඳුන්ගේ මව එරන්දතී බවත්, පියා පූර්ණක යක්ෂයා බවත් පැවසේ. පර්යාය නාම රැසකින් හැඳින්වෙන දෙවිඳුට දැඩි සිතක්ද, මුඩු වූ හිසක් ද ඇති හෙයින් 'දැඩිමුණ්ඩ' නමින් හඳුන්වන බව කියයි. පුරාණෝක්ති සංග්‍රහයට අනුව දැඩිමුණ්ඩ දෙවි සම්බන්ධ උපත් කථා රාශියකි





(මහේන්ද්‍ර,2003). ශ්‍රී සිද්ධ සූනියම ගම්භාර දෙවිඳු, දැඩිමුණ්ඩ දෙවියන්ගේ අධිකාරම ලෙස යුක්තිය පසිඳලන්නා වූද, යහපත කරන්නන් ට යහපත් ප්‍රතිඵල ද, අයහපත කරන්නන්ට අයහපත් ප්‍රතිඵල ද, ලබා දෙන්නා වූ අර්ධ දේව ස්වරූපයක් ද, අර්ධ යක්ෂ ස්වරූපයක් ද, සහිත දෙවි කෙනෙක් බව ප්‍රකට ය. වැව් බැඳි රාජ්‍යයට, වන්නි හත්පත්තුවට, දැදුරු ඔයෙන් උතුරට, වැව් සියපත්තුව ට අයියනායක දෙවිඳුන්ගේ තෙදබල පවතින බව විශ්වාසයේ පවතී. අයියනායක දෙවිඳුට පර්යාය නාම පනහක් සහ ජනකථා රාශියක් ඇතිබව පැවසේ. ඓතිහාසික, පෞරාණික වැදගත්කමක් ඇති 'දෙවොල් දෙවි විමන දෙවොල' හික්කඩුව, සීනිගම ප්‍රදේශයේ පිහිටා ඇත. 'වෙරගොඩ දෙවියෝ' නමින් ද හඳුන්වනු ලබන මෙම දෙවියන් සම්බන්ධ ජනප්‍රවාද රාශියක් පවතී. දෙවොල් දෙවි පුදපූජා සැලකීමේදී ධීවර කර්මාන්තය හා කුරුඳු කරමාන්තය වැදගත් තැනක් ගනියි.

ප්‍රාදේශීය දෙවිවරුන් අතර මංගර දෙවිඳුට හිමි වන්නේ වැදගත් තැනකි. ගොපලු දෙවි ලෙස ද ව්‍යවහාර කරන මෙම දෙවිඳුට උත්පත්ති කථා දහතුනක් තිබේ. කිරි මඩුව, පූනා මඩුව මංගර දෙවියන් වෙනුවෙන් පුදකෙරේ. කැළණි මිටියාවතෙහි රංවල දෙවි පිදීම ප්‍රධාන අතර, 'පුහුල් පහන් පූජාව' එම දෙවිඳු වෙනුවෙන් කෙරේ. මෙරට දේව සංකල්පය තුළ ප්‍රාදේශීය දෙවිවරු රාශියක් මීට අමතරව පූජාවට පාත්‍ර වේ. සිංහල දේව පුරාණයෙ හි මෙරට පුදලබන දෙවි දේවතාවෝ දෙසිය හතළිස් දෙකක් පිළිබඳ තොරතුරු අනාවරණය කෙරේ. බණ්ඩාර සමූහයට අයත් දෙවිදේවතාවුන්ගේ ගණන නිවැරදිව ඉදිරිපත්කළ නොහැකි බව මහාචාර්ය නන්දසේන රත්නපාල පවසයි. ඊබට් අමරසේනගේ 'සිරිලක පුද ලබන දෙවිවරු' කෘතියෙහි දෙවිවරු තිස් දෙනෙකු පිළිබඳ තොරතුරු දක්වන අතර, දෙවිදේවතාවුන් දෙසිය හතළිහකගේ නාම ලේඛණයක් ද ග්‍රන්ථයේ අවසානයෙ හි එක් කොට තිබේ. 'ශ්‍රී ලංකාවේ දේවතාවියෝ සහ යක්ෂණියෝ' යන කෘතියෙහි පූජාවට පාත්‍ර වූ දේවතාවෝ රැසක් පිළිබඳ ව හෙළිදරව් කරයි.

## 6. යකුන් තොවිල්

තොවිල් සම්ප්‍රදාය තුළ මූලික වශයෙන් යකුන් ප්‍රධාන පිදවිලිදීම, දරහැට දීම, දෑපීම, හූනියම් කැපීම, මළගිය දෝෂ ඉවත් කිරීම, යකුන් බැඳීම, සන්නි යකුම, මහසොහොන් සමයම ආදී බොහෝ ශාන්තිකර්ම අන්තර්ගත ය. දෙවියන් වෙනුවෙන් කරනු ලබන ශාන්තිකර්මවල දී උප සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වන්නාක් මෙන් ම තොවිල් වලදී ද සුවිශේෂ ලක්ෂණ විද්‍යමාන වේ. දෙවියන්ට 'අඩුක්ක' ලෙස ශීතයයි සම්මත කෑමවර්ග පුදන අතර, යකුන්ට 'දොලපිදේනි' පිදීමේ දී උෂ්ණ යයි සම්මත ආහාර වර්ග ගනු ලැබේ. මෙහි දී පුලුටු (පුලුස්සන ලද මස් හෝ කරවල-ගොඩදිය මස්) පුලුටු පහ (බදින ලද අබ, වී, තල, මුං, මෑ-ඇට ඇටි පහ) ආදිය විශේෂයෙන් ගනු ලැබේ. දෙවියන් ට මෙන් ම මල්වල පාට, තිරවල පාට ආදි වර්ණය ඒ ඒ ශාන්තිකර්මවල දී විශේෂය. භාෂා ව්‍යවහාරය ද වෙනස් වේ. දෙවියන්ගේ කටයුතු කරන්නාට විශේෂ නාම භාවිතයන් ඇත්තා සේම. තොවිල් කරන්නෝ ද, යක්දෙහිරාළ, යක්දෙස්සා, යකැදුරා, කට්ටඬියා වශයෙන් ද, යකුන්ගේ කංකාරිය කරන්නා ඇදුරා හා මන්ත්‍රකාරයා ලෙස ද හඳුන්වනු ලැබේ. දොලපිදේනි සකස් කරන්නා කොට්ටෝරුවා කොට්ටෝරුරාළ, වට්ටෝරු රාළ යනුවෙන් ව්‍යවහාර කෙරේ. කොට්ටෝරු බත, හත් මාළුව, විසිහත් මාළුව, රොටි පිසින්නේ කොට්ටෝරු මඩුව තුළ ය. දේවදානය නීච ය යි සම්මත සතුන්ට දෙනු නොලබන අතර. දොල පිදේනි බලු කපුටෝ අනුභව කරති. තොවිල් වලදී භූතයින් ට ගොටු දෙන කණුව හඳුන්වන්නේ 'ඇවිරිකණුව' ලෙසය. දෙවියන්ට සම්පාදනය කරනු ලබන ආහාර වලට 'පවිත්‍රත්වය' මූල්වන අතර, යක්ෂ, ප්‍රේත, භූතාදීන්ට දෙනු ලබන පූදපෙත්වලදී සම්පාදනය කරනු ලබන ආහාර කෙරෙ හි පවිත්‍රත්වය පිළිබඳ එතරම් සැලකිල්ලක් දක්වන්නේ නැත.

ප්‍රාග් බෞද්ධ යුගයේ පැවැති ඇදහිලි අතුරෙන් 'යකුන් පිදීම' ප්‍රබල ව පැවති ඇත. දසිස්, දසගිව් ලෙස හැඳින්වෙන රාවණ යුගයේ ලක්වැස්සෝ රාක්ෂය නම් වූහ (මහේන්ද්‍ර,2003). 'රාක්ෂ සේන්ද්‍ර' යනු රාවණට අපර නාමයකි. කුවේණිය (කුවණ්නා) ද යක්ෂ





ගෝත්‍රික කාන්තාවකි. ඇය කළු යකාගේ මව යයි සැලකේ. පණ්ඩුකාභය රාජ්‍ය සමය යකුන් පිදීම මෙන් ම යකුන් යක්ෂණියන් ගැන කියවෙන කාල පරිච්ඡේදයකි. චිත්තරාජ, කාලවේල, මහේජ, පුතිජන්ධර වැනි යක්ෂයින් හා චේතියා, වළවාමුඛී, පච්ඡිම රාජිණී වැනි යක්ෂයින් ද ඒ අතර සිටි බව දක්වේ (මහාවංශය,2007). වැදි ජනයා අතර මියගිය යකුන් හා යක්ෂණියන් පිදීම අදටත් පිළිගන්නා චාරිත්‍රයකි. බුදුරදුන් මහියංගනයට වැඩි අවස්ථාවේ වර්ෂාවාතාන්ධකාරාදියෙන් මෙන් ම තේජෝ කසින සමාපත්තියට සමවැදී ගිනිදැල් මවා යක්ෂයින් බියගන්වා 'ගිරිදිවයින'ට පළවා හැරි බවට මහාවංශය, දීපවංශය,ථූපවංශය වැනි ප්‍රාථමික මූලාශ්‍රයවල දක්වේ. කුවේණිය නතරකළ 'යක්ෂගිරි දිවයින' තම්මැන්නා අඩවියේ 'පඩුරුකෝවිල' පිහිටා ඇතැ යි පැවසේ.

යක්ෂ, රාක්ෂ සංකල්පය බුදුදහමින් ප්‍රතික්ෂේප වූවක් නොවේ. බෞද්ධ සාහිත්‍යයේත්, බුද්ධ චරිතයේදීත් යක්ෂ, රාක්ෂ සංකල්පය විද්‍යමාන වේ. බුදුන් වහන්සේ ජන ආගමට අනුව දෙවියන්ගේත්, යක්ෂයින්ගේත්, නායකයාය. බෝධිසත්වයන් වහන්සේ පාරමිතා පුරණ කාලවලදී යක්ෂ, රාක්ෂ, භූත, අමනුෂ්‍යාදී බලපෑම් එල්ල වූ බව නලපාන ජාතකය, දේවධර්ම ජාතකය, විදුර ජතකය ආදිය පිරික්සීමේ දී අණාවරනය විදුර ජතකය ආදිය පිරික්සීමේදී අනාවරණය වේ (රණවීර(සංස්), 2009). ත්‍රිපිටකයේ බොහෝ තැන්වල විශේෂයෙන් සූත්‍ර පිටකයෙ හි යක්ෂයින් පිළිබඳ ව දක්වේ. රතන සූත්‍රය දේශනා කිරීම ට පාදක වූ එක් හේතුවක් වූයේ විශාලා මහනුවර පැවති අමනුෂ්‍ය (යක්ෂ) බියයි. ආලවක යක්ෂයා අරමුණු කොට ආලවක සූත්‍රයත්, වෛශ්‍රවණයන්ගේ ඉල්ලීම පරිදි නොසතුට ට පත් අමනුෂ්‍ය ගණයා පිනවනු වස් ආටානාටිය සූත්‍රයත්, දේශණා කරන ලද බව නිධාන කථා තුළින් හෙළිදරව් වේ. කාලි යක්ෂණිය ට දෙවොලක් තනවා පුද සත්කාර නියම කරන ලද්දේ බුදුරදුන් ය. ඇය බුදු බණ අසා සෝවාන් වී, මිනීමස් අනුභවය අතහැර ඉතා සාමාකාමී දිවිපෙවෙතකට පත් වූ බව දක්වේ. ත්‍රිපිටකානුගත තොරතුරුවලට අනුව යක්ෂයින්ගේ අධිපතියා වෛශ්‍රණ (කුවේර) වේ. බුද්ධකාලයේ විසූ යක්ෂයින් පිළිබඳ ව තවදුරටත් මූලාශ්‍රයවල (යක්ඛ සංයුක්තය) දක්වේ. ඒ

අතර ඉන්දක යක්ෂයා, ශක්‍ර යක්ෂයා, සුචිලෝම යක්ෂයා, මණිභද්ද යක්ෂයා, පියංකර මතා යක්ෂණිය, උත්තරමාතා යක්ෂණිය පුනබ්බසු මාතා යක්ෂණිය ආදිය පෙන්වා දිය හැකි ය. දසබිම්බර මාර සේනාවෙ හි ද යක්ෂ අවතාර, රාක්ෂස අවතාර, භූත අවතාර හා අසුර අවතාර පිළිබඳ දැක්වේ. ත්‍රිපිටකානුගත තොරතුරුවලට අනුව පෙනී යන්නේ යක්ෂ රාක්ෂයින් අස්වාභාවික ගතිපැවතුම්, රූප ශෝභාව ඇති මානව කොට්ඨාසයක් බව යි.

මෙරට ජනසමාජය පිරික්සීමේදි ද යක්ෂ, රාක්ෂ සංකල්පය බෙහෙවින් ඉස්මතු වේ. ගෙවලයකා, ගෙවල යක්ෂණිය, බාලගිරි ප්‍රසිද්ධ යක්ෂයෝ ය. කළුකුමාරයා යනු කළුයකා හෙවත් කාලවේලගේ පුනර්භවයක් සේ සැලකේ. මහා වංශයේ සඳහන් වන 'රත්තක්ඛි' නම් යක්ෂයා සිරිසඟබෝ රජු දවස වසංගත අක්ෂි රෝගයක් පමුණුවනු ලැබූ බව ඇක්වේ. ප්‍රධාන තොවිල් අතර හූනියම, සූනියම් යාගය, සූනියම් කැපිල්ල, සූනියම් ශාන්තිය, විත ශාන්තිය, මැණික්පාල ශාන්තිය, ඔඩ්ඩිස යාගය ආදිය සූනියම් යකා උදෙසා පවත්වනු ලබන ශාන්තිකර්මයෝය (කාරියවසම්,1996). අව පක්ෂයේදී යක්භවෙ හි වෙසෙන සූනියම් යකාට ඇරයුම් කිරීමේදී දිෂ්ටි, මන්ත්‍ර, යාදිනි, කන්නලව්, අටකොණ ආදී ගද්‍ය හා පද්‍යමය මන්ත්‍ර, කවි ආදියෙන් ඇරයුම් කෙරේ. යක්ෂයින් අතර ඉතා භයානකවුත්, බලසම්පන්නවුත්, යක්ෂයා ලෙස සැලකෙන්නේ රීරියකා ය. ජලකඳ රිරි යක්ෂයා, ජලතා මදන යක්ෂයා රීරි යක්ෂයා ට අපරනාමයෝ වෙති. මරු රිරි යක්ෂයා, දළරිරි යක්ෂයා(දළ කුමාර, දළ කඩවර), මළකඳ රිරි යක්ෂයා, පුළුටුකාම රිරි යක්ෂයා, මරු අප්පොච්චි, සිද්ධ රිරි යක්ෂයා හා මරුකාල යක්ෂයා වශයෙන් රීරි යකාට අව්තාර හතක් ද, මරු රිරි යක්ෂයා ට අවතාර දහඅටක් ද ඇතැ යි විශ්වාස කෙරේ. රිරි යකා ලේ සම්බන්ධ විවිධ රෝගාබාධ බොහොමයකට සම්බන්ධය යි දක්වා සන්තියාගය හෙවත් රීරියක් පිදෙන්න දීම මෙහිදී සිදුකෙරේ (ජයසිරි,2016). ඉරමුදුන් පිදේනිය, ඉරමුදුන් දොළ, ඉරමුදුන් සමයම, ඉරමුදුන් රීරි බන්ධනය ආදිය රීරියකා හා සම්බන්ධ යාතුකර්මයෝ ය.





මහසොහොන් යකා සොහොන ළඟ සිටින, සොහොන ළඟ හැසිරෙමින්, මළමිනී අනුභව කරන බව විශ්වාසයේ පවතී. මෙම යකා යකුන් හත් ලක්ෂයකට අධිපතියයි සැලකේ. මහසොහොන් යක්ෂයා පුද ලබන්නේ මහසොහොන් සමයමෙහි ය (කාරියවසම්,2001). සන්නියකාගේ පිරිස ද දහඅටකි. සන්නි යකුම් යාගය ඔවුන්ගෙන් එන විපත් සමනය සඳහා කරන ශාන්තිකර්මයකි (කාරියවසම,2001). ගෙවල යකුන් පිදීම සඳහා යාතුකර්ම ද පවතී. 'ගරායකුම' ඒ අතර වැදගත් තැනක් ගනියි. ගරා යකුන් දොළොස් කට්ටුවකි. රටයකා පුදනු ලබන්නේ රටයකුම හෙවත් රිද්දි යාගයෙ හි ය. මොවුන් ට 'වඳයක්කු' යයි ද ව්‍යවහාර කරති. මෙම යකුන්ගේ නායිකාව රිද්දි බිසවයි. ඇගේ දියණිවරු වඳබිසව් සත්දෙනා රටයකුමේ දොළහ පාලියේ සඳහන්වේ (හේමසිරි හිමි,1986). තොටයකා තවත් පුදපූජා කරනු ලබන යක්ෂයෙකි. මොහුට දෙන පිදේනි දිය තොටක් ළඟ තොට කණුවේ පන්දමක් අවුලුවා ඔප්පු කළයුතු වේ. කාන්තාවන් ට ලෙඩ කරන ප්‍රධානත ම යක්ෂයා කළුකුමාරයා ය. කළුකුමාරයාගේ අවතාර හතකි. පිරිවර ලෙස යක්ෂයෝ තිහක් වෙති (කෝට්ටේගොඩල 1998). ගොපලු යකා සූනියම දෙවිඳුගේ අවතාරයක් සේ සැලකේ. ගොපලු දිෂ්ටිය වැටී රෝගී වූ අයට 'ගොපලු සමයම' ශාන්තිකර්මය කරනු ලැබේ. මෙයට දෑපීම විසිහතරක් හා සමයම් දොළහක් අයත් වේ (ලියනගේ,2001).

මහා සමයම් පැදුරේ එන කව්වල යක්ෂණියෝ රැසක් දක්වේ. ඒ අතර ළමයා දේවිය යකින්නිය, පුෂ්පගිරි යකින්නිය, ඔකඳගිරි යක්ෂණිය, සිරියා දේවි යකින්නී, මෝලන්ගර නම යකින්නිය, පට්ටිගිරි නම් යකින්නිය, නීලකුමාරි නම් යක්ෂණිය, අඳුන් කුමාරි හා සඳුන් කුමාරී නම් යක්ෂණිය යනාදී වශයෙන් 'සමයම් පැදුරට' ආරාධනා කෙරේ. රීරි යක්ෂයාගේ භාර්යාව රීරි යක්ෂණිය වේ. යක්ෂණියන් අතර අටයෝගිණී යක්ෂණියෝ (අෂ්ටකාම යක්ෂණියෝ) වැදගත් තැනක් ගනියි. ඒ ඒ වෙලාව ට, ඒ ඒ දිසාවෙහි මෙම යෝගිණී යක්ෂණියෝ අටදෙනා රැකසිටින බව කියනු ලැබේ. යක්ෂණියන් සම්බන්ධ කරුණු විග්‍රහ කිරීමෙ දි

කාලගිරි දෝෂයට වැදගත් තැනක් ලැබී ඇත. මෙහිදී බැල්ම හෙළන යක්ෂණියෝ රාශියක් සිටිති. බිළිඳු හා ළදරු අවධියේ දී මෙම යක්ෂණියන්ගේ බැල්ම වැටෙන බවත්, ඒ සඳහා විවිධ ශාන්තිකර්ම රැසක් අනුගමනය කරන බවත් පෙනේ. මෙයට අමතරව ජනආගමේ එන ඇදහිලි විශ්වාස අතර ඉරලා මෝහිනී යක්ෂණිය (මෝහිණී අවතාරය), කර්ණ යක්ෂණී, ත්‍රී නේත්‍රධාරී, මිණී හිසක් ඇති කාලිකා දේවී යක්ෂණිය, ගෝඹර නාවචි යක්ෂණිය, මදුරු මා දේවී යක්ෂණිය, සන්නි මෝහිණී යක්ෂණිය, අමුක්කි ගෙවත් අනකී යක්ෂණිය, අරුන්දි යක්ෂණිය, දෝස ගිරි යක්ෂණිය, නාග පත්‍ර කාලී යක්ෂණිය, නාරසිංහ යක්ෂණී, නා නා රූපී යක්ෂණී, වට්ටක්කණ්ඩි බිසව හා වදවල් බිසව වැදගත් තැනක් ගනියි (කාරියවසම්,1992).

## 7. ග්‍රහ ශාන්තිකර්ම

මානවයාගේ යහපත් පැවැත්මට උපකාර වන්නේ ය යි සැලකෙන ජ්‍යොතිර් විද්‍යාව ත්, ආයුර්වේදය ත් අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවයකි. මෙකී මානව ශාස්ත්‍රයන්ගේ ආරම්භය කිනම් කාල වකවානුවක සිදුවූවා දැ යි පැහැදිලිව ම නිගමනය කළ නොහැකි ය. මානව වර්ගයා තමා ට බොහෝ ඈතින් රාත්‍රී කාලයේ දී දක්නට ලැබෙන විවිධාකාර වූ ලක්ෂණයන් ගෙන් යුත් ග්‍රහ තාරකාවන්ගේත්, නක්ෂත්‍ර තාරකාවන්ගේත් බලපෑම තමාට ත්, තමා ජීවත්වන පරිසරයටත්, කුමන ආකාරයෙන් ඇතිවේද යන්න තේරුම් ගැනීම ට කරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් ජ්‍යොතිර් විද්‍යාව බිහි වී ඇතැයි සැලකේ. රවි, චන්ද්‍ර ආදී ග්‍රහයන් දොළොස් දෙන ඔවුනට ඉතාමත් දුරින් වලයාකාරව පිහිටි නක්ෂත්‍ර තරකාවලිය මධ්‍යයෙහි ගමන් කිරීම නිසා සිදුවන සංයෝග, වියෝග ආදියෙන් ඇති වන්නා වූ නා නා ප්‍රකාර ගුණාගුණ මානවයාට ත්, ඔහුගේ පරිසරයට ත් බලපාන ආකාරය විස්තර කරදෙන ශාස්ත්‍රය ජ්‍යොතිර් විද්‍යාව යයි හඳුන්වනු ලැබේ. මෙම ග්‍රහයින්ගේ බලපෑම ට යටත් නොවන





සතෙක් හෝ පැළෑටියක් මිහිපිට නැතැයි විශ්වාස කෙරේ (සීලරතන හිමි,2005).

චන්ද්‍රයා අහසෙ හි ගමන් කරන මාර්ගයෙ හි පිළිවෙලින් පිහිටා ඇති තාරකා පංති විසි අට මත ජ්‍යෝතිෂ්‍යය සකස් වී තිබෙ. මෙවා 'අටවිසි නැකැත්' ලෙස සලකනු ලැබේ. එනම්; අස්විද, බෙරණ, කැති, රෙහෙණ, මුවසිරස, අද, පුනාවස, පුෂ, අස්ලිය, මං, පුවපල්, උත්‍රපල්, හත, සිත, සා, විසා, අනුර, දෙට, මුල, පුවසල, උත්‍රසළ, සුවණ, දෙනට, සියාවස, පුවපුටුප, උත්‍රපුටුප සහ රේවතී වශයෙනි. උත්‍රසළ නැකත ළඟට අභිජිත් නැකත ද යොදා නැකැත් විසි අටක් දක්වන අවස්ථා ද වේ (ලියනගේ,1996). ඒ ඒ නැකතට හිමි යෝනියක් ද දක්වා තිබේ. ඒවා පිළිවෙලින් අශ්ව, ඇත්, එළුදෙන, සර්ප, සැපිනි, සුනඛ, බළල්, එළු, බැළලි, මූෂික, මූෂික දෙන, ගවදෙන, මීදෙන්, ව්‍යාඝ්‍ර, මී ගව, ව්‍යාඝ්‍රදෙන, මුවදෙන්, මුව, සුනඛදෙන, වැඳිරි, මුගටිදෙන, වඳුරු, සිංහ දෙන, වෙළඹ, සිංහ, ගව හා ඇතිනි යනුවෙනි. නැකැත්වලට අදාළ නියමිත වෘක්ෂයක් ද පුද්ගලයාට හිමිවේ. ඒවා පිළිවෙලින් ගොඩකු, නෙල්ලි, අත්තික්කා, මාදන්, කළුවර, කිහිරි, උණ, ඇසතු (බෝ), දොඹ, නුග, කැල, අරලිය, දිඹුල්, බෙලි, කුඹුක්, සපු, මූනමල්, වැටකේ, ඉඹුල්, අසෝක, කොස්, වරා, සමදරා, කොලොම්, මී අඹ, කොහොඹ සහ මී වෘක්ෂයයි (පෙරේරා,2007).

මෙම නැකැත් විසිහත පක්ෂීන් පස්දෙනෙක් සඳහා බෙදී යයි. එම පක්ෂීහු නම් රාජාලියා, පිංගල පක්ෂියා (බකමූණා), කාක පක්ෂී, කුක්කුට පක්ෂී(කුකුළා) සහ මොණරාය. එමෙන් ම ඒ ඒ නැකතට හිමි වර්ණය ද, එනම්; බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර පංචම හා සංකර වශයෙන් ද, ඒ ඒ නැකැත්වලට අයත් ලිංග ද, නැකැත් අධිපති ග්‍රහයා ද දක්වා තිබේ. උපත ලබන සෑම ජන්මියෙකුට ම ලග්නයක් හිමිවේ. ලග්න හෙවත් රාශි ලෙස හැඳින්වෙන්නේ තරු මඬුලු ය. සමකය ට ප්‍රතිමුඛ ලෙස ආසන්න ම කිරණ විහිදුවමින් වැඩිම බලපෑමක් එල්ල කරන තාරකා රාශි දොළහ ජ්‍යොතිෂ්‍ය විද්‍යාවේ දී, මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍යා, තුලා, වෘශ්චික, ධනු, මකර, කුම්භ, මීන ලෙස ලග්න සංකේත බවට

පත්කර ගෙන ඇත. සෑම ලග්නයකට ම ලග්නාධිපති ග්‍රහයෙකු වේ. හිරුගෙන් නිකුත් කරන කිරණ මෙම ග්‍රහයින් මත පතිත වී, යළි පරාවර්තනය කරා ඒමෙදී එම කිරණ තුළින් පෘතුවි වාසීන් ට විවිධාකාර බලපෑම් ඇතිවන බව පිළිගැනේ. හිරු, සඳු, සිකුරු, ගුරු, බුධ, සෙනසුරු, කුජ යන ග්‍රහයින් ට අමතරව නෙප්චූන්,යුරේනස්, ප්ලූටෝ ග්‍රහ මණ්ඩලයට එකතු වී ඇති අලුත් ග්‍රහයෝය. මෙම ග්‍රහයින් ට අමතර ව 'ඡායා ග්‍රහයින්' ලෙස හැඳින්වෙන රාහු හා කේතු ද වැදගත් ය. මෙවා දෘශ්‍යමාන ග්‍රහ වස්තු දෙකක් නොවේ. සංකල්පීය ලක්ෂ්‍ය දෙකක් පමණි. යුරෝනස්, නෙප්චූන්, පුලූටෝ යන ග්‍රහයින්ට සේම රාහු හා කේතුට ද රාශි අධිපතිකම් හිමි වී නැත (ජයසිංහ,2005).

දොළොස් රාශිය, රාශි දොළහ හෙවත් ලග්න දොළහ ජන්ම පත්‍රයක කොටු දොළහ තුළ පිළිවෙලින් තැන්පත් වේ. ඊට අධිපති ග්‍රහයා ද ඒ සමඟින් ම වේ. භාව දොළහ ප්‍රධාන නාම දොළහකින් හැඳින්වේ. එනම්, ලග්නස්ථානය, ධනස්ථානය, වික්‍රමස්ථානය, බන්දුස්ථානය, ප්‍රත්‍රස්ථානය, රෝගස්ථානය, විවාහස්ථානය, මාරකස්ථානය, පුන්‍යස්ථානය, කර්මස්ථානය, අයස්ථානය සහ වැයස්ථානයයි. පුද්ගලයාගේ ආයුකාලය 120 ක් සේ සලකා, මහ දශා දැක්වීමේ දී ආයුකාලය කොටස් නවයකට බෙදා ග්‍රහයින් නම දෙනාට එහි අයිතින් පවරා ඇත. මහදශා කාලය අතුරු දශා, විදශා, ලෙස ද වර්ග කෙරේ. මේ අනුව පලාඵල කථනය සිදු කෙරේ.

ජ්‍යොතිෂ්‍යයෙ හි වැදගත්කම වන්නේ යහපත, අයහපත දෙක ම පුද්ගලයා ට ජීවිත කාලය තුළ දී කර්මානුරූපව ලැබීමයි. සෑම පුද්ගලයකුට ම උපතේදී ම 'යෝග කාරක ග්‍රහයෙකු' මෙන් ම 'මාරක ග්‍රහයෙකු' ද වේ. ග්‍රහ ශාන්තිකර්ම කිරීමේ දී වැදගත් ම වන්නේ ඒරාෂ්ටක අපලයයි. 'ඒර' හෙවත් ශනි අට ට පැමිණීම යනු වාච්‍යාර්ථයයි. සෙනසුරු ඒරාෂ්ටකය ත්‍රිවිධාකාර වෙයි. එනම්; ජන්ම ඒරාෂ්ටකය, ලග්න ඒරාෂ්ටකය සහ අෂ්ටම ඒරාෂ්ටකය යි. මෙම ඒරාෂ්ටක තුනට ම වඩා අශුභ ඵල ගෙන දෙන ඒරාෂ්ටක දෙකක් යෙදේ යයි සැලකේ. එනම්; උපතේ දී සඳු ලග්නයේ සිටි පුද්ගලයාට හිමිවන ඒරාෂ්ටකයයි. පළමුවන භාවයේ සඳු සිටින





බැවින් ජන්ම ඒරාෂ්ටකය ද, පළමුවන භාවය හෙවත් ලග්නය ට සෙනසුරු පැමිණීමෙන් ලග්න ඒරාෂ්ටකය ද එකවිට යෙදේ. එනම්; ජන්ම ලග්න යුගල ඒරාෂ්ටකය යි. මෙය ඉතා ප්‍රබල ලෙස අශුභ ඵල උදාකරන්නක් බව විශ්වාස කෙරේ. එසේම උපතේ දී සඳු අටවන භාවයේ සිටින ජන්මීන්ට අෂ්ටම ඒරාෂ්ටකය යෙදෙද්දී ඉබේම ජන්ම ඒරාෂ්ටකය ද යෙදේ. ජන්ම-අෂ්ටම යුගල ඒරාෂ්ටකය ද ඉතා ප්‍රබල ලෙස අශුභ ඵල ගෙන දේ ය යි පිළිගැනේ (ජයසිංහ,2005).

ග්‍රහ අපල පැමිණි විට ඒ ඒ ග්‍රහයින්ට පුදපූජා පැවැත්වීම අපල ව්‍යපසමනය කිරීමේ මාර්ගයක් වශයෙන් පෙර ඉසිවරුන් පෙන්වා ඇතැ යි විශ්වාස කරනු ලැබේ. බමුණු මන්ත්‍රානුකූලව මනුෂ්‍යයින්ට නැකැත් වලින් ද භූත, ප්‍රේතයින් ගෙන් ද, තුන් දොසින් ද, තිරිසන් සතුන්ගෙන් ද, ග්‍රහ තාරකා වලින් ද, වාසය කරන නිවාස වලින් ද, දොස් ඇති වන බව පෙර ඍෂිවරු දක්වා ඇති බව පිළිගැනේ. එසේම එම දෝෂ නැති කරගැනීම සඳහා බලිදීම, බහිරව පූජා තැබීම, අහාරපානාදිය දන්දීම, ග්‍රහ පූජා පැවැත්වීම, මන්ත්‍ර ජප කිරීම, යන්ත්‍ර බැඳීම, හෝම විධි පැවැත්වීම ආදිය ඊට ප්‍රත්‍යයයි දක්වා තිබේ. ඒවා ඊට අධිපති ග්‍රහයා ට, දේවතාවා ට මෙන්ම වෘක්ෂය ට යනාදී වශයෙනි. මේ පිළිබඳ සවිස්තරාත්මක විස්තර ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙ හි දැක්වේ. සෑම ග්‍රහයෙකු සඳහා ම පවත්වනු ලබන පූජාකර්ම හඳුන්වනුයේ බලියාග නමිනි. බලියාග කර්ම තිස්පහක් (පන්තිස් බලියාග) විවිධ ග්‍රහ අපල සඳහා තැබීම ට නියම කර ඇත. ඒවානම්;අත්බලි, බත්බලි, වැල්බලි, මාංගබලි, දේවබලි, නරබලි, යුගබලි, වරුසබලි, මාස්බලි, පක්ෂිබලි, තිථිබලි, දිනබලි, නක්ෂත්‍රබලි, රාශිබලි, චක්‍රබලි, හිංසතරබලි, අවරාක්ෂබලි, රූපබලි, ප්‍රතිමාබලි, කල්‍යානබලි, මංගලබලි, මධුබලි, වෙස්බලි, අෂ්ටබලි, සකබලි, යාගබලි, යක්බලි, පිසසුන්බලි, අන්නබලි, හින්බලි, කඩබලි, මල්බලි, කළුබලි, යන්ත්‍රාබලි, අගහස්බලි ආදිය යි (ලියනගේ,2001). මේවා ට අමතර ව සුවිශේෂ වූ ලංකාව ට ආවේණික බලි ශාන්තිකර්ම ද පවතී. නිදසුන් වශයෙන් කාසාබලි, කුමාර බලිය, රූපබලි, මහනිළඟ රාක්ෂ බලිය (සෙනසුරු අපලය සඳහා) අංගම් මණ්ඩල බලිය (බ්‍රහස්පති ග්‍රහයාට),

අංගනාධිපතිරාක්ෂ බලිය (අඟහරු ග්‍රහයාට), අනුවස් මංගල බලිය (සෙනසුරුට), අභයමණ්ඩල බලිය (බුධ ග්‍රහයාට) හා අෂ්ට නාග බලිය (රාහු ග්‍රහයාට) යනාදි වශයෙනි.

'බලි' යන්නෙහි මූලික අර්ථය නම් පූජාව යන්නයි. භූත විද්‍යාත්මක අභිචාර විධි ගණයට අයත් වන බලියාගයට ශාන්තිකර්ම අතර විශේෂිත අනන්‍යතාවකින් යුක්තව ගොඩනැගී තිබේ. මෙම ශාන්තිකර්ම වලදී ද 'පවිත්‍රත්වයට' මුල්තැන දේ. භෝජන සැප කිරීමේ දී භෝජන තටුව නමින් ස්ථානයක් බලි පාමුලෙහි වේ. සැපකරන භෝජන නම්; හත්මාළුවක්, බත්, කැවුම්, කෙසෙල්, අග්ගලා, විළඳ, රොටී හා පළතුරු වර්ගය. එසේම අල වර්ග පහක් ගෙන ඒවා තම්බා 'අලපහ' යනුවෙන් ගනු ලැබේ. 'බඩපහ' වශයෙන් කෙසෙල් බඩ, පුවක් බඩ, තල් බඩ, අන්නාසි බඩ හා ගහ බඩ ගනුලැබේ. 'තෙල්පහ' යනුවෙන් තෙල් වර්ග පහක්ද, 'පැණිපහ' නමින් පැණි වර්ග පහක්ද ගනු ලැබේ. මෙහිදී සපයා ගතයුතු දෑ අතර 'නවකොළ අත්තට' විශේෂ තැනක් හිමිවේ. නවග්‍රහයින්ගේ වාස භූමීන් හි සෙවන සලසන වෘක්ෂ ලෙස සැලකෙන වෘක්ෂ නවයකින් ගන්නා ලද අතු කිනිති වලින් මේය සාදාගනු ලැබේ. මේවා නම් රවි ග්‍රහයා ට ඉඹුල් කොළ, සඳුට දිවුල් කොළ, කුජ (අඟහරු)ට කොලොන් කොළ, බුධ ට කොහොඹ කොළ, ගුරු (බ්‍රහස්පති) ට බෝ කොළ, ශුක්‍ර (සිකුරු)ට කරඳ කොළ, ශනි ට නුග කොළ, රාහු ට වැටකේ කොළ සහ කේතු ග්‍රහයා ට රඹ (කොසෙල්) කොළ වශයෙනි (පියසේන,1998).

**සාරාංශය**

කාල පරාසය පිළිබඳ සලකා බැලීමේ දී, ඉපැරණිම වෛද්‍ය කර්මය ආයුර්වේදය බවත්, ඉපැරණිම ආගම හින්දු ආගම බවත්, ඉපැරණිම මානව ශාස්ත්‍රය ජ්‍යෝතිර් විද්‍යාව ලෙසත් පිළිගැනීම සාවද්‍ය නොවේ. සුපරික්ෂාකාරිව බැලීමේ දී මෙම තේමාවන් තුනෙහි එකිනෙකට බැඳීගිය මනා සම්බන්ධයක් ද පවතින බව පෙනේ. අතීතයේ දැනුමේ කේන්ද්‍රස්ථානය වූ





ආසියාවෙ හි මෙම සංකල්පයන් තුනම බිහිවී ඇත. ශාන්ති කර්ම දෙස බැලීමෙ දී මෙකී අංග තුනෙ හි පැහැදිලි සබඳතාවය ද විද්‍යමාන වේ. මෙම සියල්ලක් ම ඍෂිභාෂිතයන් බව පිළිගැනේ. ශාන්තිකර්මයන්වලදී පුමුඛතාවය ලබාදෙන සියලූ දෙවි දේවතාවෝ හින්දු ආගමෙහි බහුදේවවාදයට අයත් වූවෝ වෙති. අෂ්ටකර්මය ට අයත් සියලූ දෙවියෝ හින්දු දෙවිදේවතාවෝ ය. බොහෝ ප්‍රතිකාර සම්ප්‍රදායන් ට ආයුර්වේදයේ ආභාසය ලැබී තිබේ. සියලු ග්‍රහ ශාන්තිකර්ම පෘතුවිය ට ආසන්න ම ග්‍රහයින් නව දෙනෙකුගේ හේතුවෙන් පෘතුවිය මත පතිත වන අහිතකර කිරණ වලින් මිදීම පිණිස සම්පාදනය කරගෙන ඇත.

ආයුර්වේදයේ පරමාර්ථ දෙකක් ඇත. එය 'ස්වස්ථ පරායන' සහ 'ආතුර පරායන' වශයෙන් හඳුන්වනු ලැබේ. යම් පුද්ගලයකුගේ නීරෝගීභාවය ආරක්ෂා කිරීම ත්, ඒ සඳහා උපදෙස් දීමත්, ස්වස්ථ පරායන වශයෙන් හැඳින්වේ. යමෙකු ගේ රෝගයට පිළියම් යොදා එය මඟහැරවීම 'ආතුර පරායන' වශයෙන් හැඳින්වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම අදෙසා අංග උටකින් යුත් ආයුර්වේදය බිහිවී ඇත. එම අංග අට ට අයත් එක් ප්‍රධාන ක්ෂේත්‍රයකි භූත වෛද්‍ය විද්‍යාව. එය ද ප්‍රධාන කොටස් අටක ට බෙදා දක්වා ඇත. භූත විද්‍යාව යනු දේව, අසුර, ගාන්ධර්ව යනාදී ආවේශයන් ඇති කරන, එසේම උපද්‍රව ඇති කරන, එම භූත බලයන් සමනය සඳහා කරනු ලබන බලි තොවිල්, යන්ත්‍ර මන්ත්‍ර, පුදපූජා ඇතුලත් අංගය ලෙස නිර්වචනය කෙරේ. අග්නිපුරාණය, ගරුඬ පුරාණය යන ග්‍රන්ථ වල භූත විද්‍යාත්මක කරුණු සඳහන් බව දැක්වේ. එමෙන් ම අථර්වන් වේදයේ ද, සුශ්‍රැතයේ උත්තර තන්ත්‍රයේ අමානුෂික ප්‍රතිශේධ අධ්‍යායේ ද, චරකයේ චිකිත්සා ස්ථානයේ ද, උන්මාද චිකිත්සාවේ ද, වාග්භටයේ උත්තර තන්ත්‍රයේ ද, භූත බලපෑම් නිසා ඇති වන උපද්‍රව අක්වා තිබේ.

ආයුර්වේද ග්‍රන්ථවල භූත වෛද්‍ය විද්‍යාව ට එතරම් වැදගත් තැනක් ලබා දී නොමැති බව පෙනුන ද, අෂ්ටාංග ආයුර්වේදය ඉගනගන්නා සිසුන්ට භූත විද්‍යාවද වැදගත් විෂයයක් බව ආයුර්වේද වෛද්‍ය මතයයි. ඒ මක්තිසාදයත් වා, පිත්, සෙම් කිපීම

සඳහා දෙහි කැපීම, නවග්‍රහයින්ගෙන් පැමිණෙන රෝග, දෝෂ සඳහා යන්ත්‍ර පැළඳීම හා එත්පිළිවෙත් කිරීම, මළ යක්ෂයින්ගෙන් වන්නා වූ දෝෂ ඉවත් කිරීම, හදි හූනියම් නිසාවෙන් වන රෝග, දෝෂ දුරුකිරීමේදී අට අනූවක් රෝග, නව අනූවක් ව්‍යාධි, දෙසිය තුනක් අන්තරාය, කල්කර්ම, අකල්කර්ම, ඇස්වහ, කටවහ, හෝවහ, සන්නිරෝග ආදි රෝග, දෝෂ සඳහා ප්‍රතිකර්ම ඇත්තේ භූත වෛද්‍ය විද්‍යාව තුළ නිසා ය.

භූත විද්‍යා කටයුතු කරන්නා තුළ නියම ගුණධර්ම තිබිය යුතු ය යි පිළිගැනේ. ඔහු මස් මාංශ, පිළිහුඬු අනුභවය, සුරාපානය, ආදියෙන් තොර වියයුතු වේ. එමෙන් ම ඇදුරුතුමා කායික ව, මානසික ව මෙන් ම වාචිකව ද පිරිසිදු විය යුතු ය. මන්ද බොහෝ ගුප්ත කටයුතුවලදී යක්ෂයින් ප්‍රේතයින් සමඟ පමණක් නොව දෙවි දේවතාවුන් සමඟ ද සබඳකම් පැවැත්වීම ට සිදු වන බැවින් ය. පිරිසිදුකම ට අමතර ව මෙම බලවේග සමඟ කටයුතු කිරීමේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියක් ද වේ. එයට යටත් ව සිදු කරන සියලුම භූත විද්‍යාත්මක කටයුතු සිදුකළ යුතුබව දක්වේ. භූතවිද්‍යාවේ ඇති වැදගත් ලක්ෂණයක් නම් එමඟින් යහපත් දේ මෙන් ම අයහපත් දේ යන දෙක ම සිදු කළ හැකි වීමයි. සමාජ මානව විද්‍යාඥයින් පමණක් නොව, අපරාධ විද්‍යාඥයින් පවා මෙමඟින් සමාජ පර්යාය (Social order) පවත්වා ගැනීමට මෙන්ම සමාජ පාලනයට (Social control) ද බෙහෙවින් ම මහෝපකාරී වන බව පවසති. එය සම්ප්‍රදායික ආධිපත්‍ය (traditional authority) තුළ විශාල කාර්යභාරයක් ඉටුකර තිබේ. පුද්ගලයා වඩාත් නිවැරදි ජීවිතයක ට යොමු කිරීම මෙමඟින් සිදු වන්නට ඇත.

ජනශ්‍රැතියට අනුව කලා අංගයක් ලෙස 'ශාන්තිකර්ම' හැඳින්විය හැකි ය. මන්ත්‍ර ශාස්ත්‍රය සිව්සැට කලාව ට අයත් ය යි සැලකෙන අතර, එය රාවණා යුගය දක්වා පැරණි ය යි සැලකේ. පොත පත හා පුස්කොළ පත් ඉරු මඟින් ද, සටහන් කොට උපදෙස් දක්වා ඇති යන්ත්‍ර මන්ත්‍ර ප්‍රමාණය දළ වශයෙන් දහ අට දහසකටත් වඩා අධික බව පිළිගැනේ. වසර දහස් ගණනකට ත් වඩා ඉපැරණි





සමහර යන්ත්‍ර මන්ත්‍ර නිර්මාණවලදී අනුගමනය කරන ලද භාෂා විලාසයන් ද සිංහල නොවන අතර, ඇතැම් යන්ත්‍ර මන්ත්‍ර නිර්මාණය කිරීම සඳහා පුරාණ ඉන්දියානු භාෂා සම්ප්‍රදායන් අනුගමනය කොට ඇති බව පෙනේ. පෙර භාරතයේ විසූ ඍෂිවරු මන්ත්‍ර විද්‍යාව මහාදෙවි ඊශ්වරයන්ගෙන් ලබාගත් බව පැවසේ. මෙම ඍෂිවරුන්ගෙන් මන්ත්‍ර විද්‍යාව ප්‍රගුණ කළ ශිෂ්‍යයෝ මෙය පරම්පරාවෙන්, පරම්පරාව ට උරුම කරන ලදි. එබැවින් මන්ත්‍ර ශාස්ත්‍රය අධ්‍යයනය කළ යුත්තේ අත්දැකීම් ඇති මන්ත්‍ර විද්‍යාධාරී ආචාර්යවරුන්ගෙන් බව පිළිගැනේ. අතීතයේ මුතුන් මිත්තන් විසින් දිවි හිමියෙන් ආරක්ෂා කරගෙන ඇති වටිනා ශාස්ත්‍රයක් වන මන්ත්‍ර ශාස්ත්‍රය පුස්කොළ පොත්වල, කඩපත් ඉරුවල, රන්පත් ඉරුවල ලියා තිබූ බොහෝ යන්ත්‍ර මන්ත්‍ර ශාන්ති විධි නිධන් කර තැබීමෙන් හා විවිධ බලපෑම්, සතුරු ආක්‍රමණ හේතුවෙන් විනාශයට ගොස් අද වන විට ඉතිරි ව ඇත්තේ ඉතා ස්වල්පයක් බව දක්වේ. ඇතැම් මන්ත්‍ර ශාස්ත්‍රයන් හි අත්දුටුවයි, සත්තයි, පිට නොදෙනු යනුවෙන් සඳහන් වී තිබීමෙන් පෙනී යන්නේ මෙම ශාස්ත්‍රයෙහි වටිනාකමයි. බුදු දහමේ අභාසය ලැබීමෙන් පසු සියලු ශාන්තිකර්මවලට ජන ආගමික ලක්ෂණ ඇතුලත් වී ඇති අතර, එය වෙනම ම සුවිශේෂී ව අධ්‍යයනය කළ යුත්තකි. එබැවින් පෙරදිග සංස්කෘතිය ට, ශ්‍රී ලාංකේය ජන සමාජය ට ආවේණික අයුරින් ගොඩනැගී ඇති ශාන්තිකර්ම ඒකරාශී කොට ආරක්ෂා කිරීම කාලෝචිත යුගයේ අවශ්‍යතාවක් වන අතර, එය අතිශයින් ම වැදගත් 'අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයක්' ආරක්ෂා කිරීමක් ද වන්නේ ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

සීලරතන හිමි, තලකිරියාවේ. (2005). ශ්‍රී ලංකාවේ රෝග සුවයට යොදන ශාන්තකර්ම ක්‍රම, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

[illegible] හිමි, පොළොම්මාරුවේ. (1986). රුහුණේ ඇදහිලි හා විශ්වාස, තරංජි ප්‍රින්ටර්ස්, ගංගොඩවිල.

චන්දිම හිමි, බෝදාගම .(2000). පිරුවානා පොත් වහන්සේ, තායිවානය.

ලියනගේ, සිරි. (1996). ජනවිද්‍යා ශබ්දකෝෂය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

ලියනගේ, සිරි. (2001). ජනශ්‍රැති ශබ්දකෝෂය, ඇස්. ගොඩගේ සහෝදරයෝ, මරදාන.

ජාතක පාළි. (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, එක්සත් සඟුහ බෞද්ධ පදනම, තායිවානය.

මහේන්ද්‍ර. සුනන්ද. (2003). පුරාණෝක්ති සංග්‍රහය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

මහාවංශය; (2007). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

කෝට්ටේගොඩ. ජයසේන. (1998). කළු කුමාරයා පුද ලබන දාරක වත් පිළිවෙත්, ජේ. කේ. පබ්ලිකේෂන්ස්, බොරලැස්ගමුව.

කාරියවසම, තිස්ස. (2001). දහඅට සන්නි විග්‍රහය, ඇස්. ගොඩගේ සහ සහෝදරයේ, මරදාන.

කාරියවසම්, තිස්ස. (2002). ශ්‍රී ලාංකික ආයුර්වේදයේ පැතිකඩක්, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.

කාරියවසම්, තිස්ස. (1992). ශ්‍රී ලංකාවේ දේවතාවියෝ සහ යකින්නියෝ, තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න.

කාරියවසම්, තිස්ස. (2001). මහසොහොන් සමයම් විමර්ශණය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.





පියසේන, ධර්මසිරි. (1988). ඌවේ බලි යාග ශාන්තිය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

ජයසිංහ, විජය ශ්‍රී. (2005). සුභ අසුභ ඔබම දැනගන්න, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව.

පෙරේරා, ජයවංස .(2007). පොරොන්දම් සිරිත, සඳමිණ ප්‍රින්ටර්ස්, පන්නිපිටිය.

ජයන්ත, ජයසිරි. (2014). ආහාර හා පෝෂණය පිළිබඳ සමාජ මානව විද්‍යාව, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට් ලිමිටඩ්), කොළඹ.

රණවීර, සරත්,(සංස්). (2009). පන්සිය පනස් ජාතක කථා පොත, වාසනා ප්‍රින්ටර්ස්, දන්කොටුව.

Ratnapala, Nandasena.(1991). Folklore of Sri Lanka, The state printing corporation.

Kusumaratna,Sagara. (2005). Indigenous Medicine in Sri Lanka, Sarasavi publishers, Nugegoda.